

# විසිවන සියවස

## ඉතිහාසයේ මගහැරුණු මොහොත සහ

# ජාතික පුනරුදය

ජාතික ජන බලවේගය

# 20වන සියවස:

## ඉතිහාසයේ මඟහැරුණු මොහොත හා

# ජාතික පුනරුදය

# 20වන සියවස:
## ඉතිහාසයේ මඟහැරුණු මොහොත හා
# ජාතික පුනරුදය

ISBN - 978-624-5602-01-8

පළමු මුද්‍රණය : 2024 ජුලි

**ප්‍රකාශනය හා මුද්‍රණය:**
නියමුවා ප්‍රකාශන,
43/20, නුගගහ පෙදෙස,
පිළියන්දල පාර,
මහරගම.

**විමසීම්:**
දුරකථනය -: +94112785612
ෆැක්ස් -: +94112786050
වෙබ් -: www.nppsrilanka.com

# 20වන සියවස:

## ඉතිහාසයේ මඟහැරුණු මොහොත හා

# ජාතික පුනරුදය


ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAVEGAYA (NPP)

# හැඳින්වීම

ඈත අතීතයේ කෘෂිකාර්මික හා කාර්මික දියුණුවක් සහිත ශ්‍රේෂ්ඨ ශිෂ්ටාචාරයකට උරුමකම් කියූ ලංකාව මේ වන විට කඩා වැටුණු රාජ්‍යයක් බවට පත්ව ඇත. ඓතිහාසික තත්වයන් යටතේ දියුණු රාජ්‍යයක්ව පැවතුණද වත්මන් තත්වයන් යටතේ නූතන දියුණු සංවර්ධිත රාජ්‍යයක් බවට පත්වීමට අපි අසමත්ව සිටිමු. අතීත කෘෂිකාර්මික සම්ප්‍රදාය මත පිහිටමින් නිෂ්පාදනය අතින් ශක්තිමත් නූතන ලංකාවක් ගොඩනඟා ගැනීමට අපට නොහැකි විය. යටත්විජිත සමයේ අග භාගය සහ නිදහස ලැබීමෙන් පසු ගත වූ දශක පහක පමණ කාලය අයත් විසිවන සියවස තුළ ඉංජිනේරු, වෛද්‍ය, ගෘහනිර්මාණ, සංස්කෘතික, පර්යේෂණ වැනි විවිධ ක්ෂේත්‍ර ගණනාවක නූතන ලාංකේය රාජ්‍යයක් ගොඩනැගීමේ විභවයන් පහළව තිබුණද නූතනත්වය සහ සංවර්ධිතභාවය කරා යන ගමන සම්පූර්ණ කිරීමට අපට නොහැකි විය. ඒ ගමන කඩාකප්පල් කළ ඊට වගකිව යුතු කණ්ඩායම වනුයේ බටහිර යටත්විජිතවාදීන්ගේ ආර්ථිකය මත යැපුණු ඒ නිසාවෙන් ශක්තිමත් දේශීය ආර්ථිකයක් ගොඩනංවා ගැනීමට කිසිදු උනන්දුවක් නොදැක්වූ නිදහසෙන් පසුව මෙතෙක් කල් නූතනත්වය වෙනුවට වැඩවසම් මනෝභාවය තම පැවැත්ම කර ගනිමින් රට පාලනය කළ දූෂිත ප්‍රභූ පාලක පංතියයි. ඔවුහු ජනතාව අතීතකාමයක සිර කරමින් අතීත සෞභාග්‍යය කරා යන ගමනක ඒජන්තයින් ලෙස ජනතාව ඉදිරියේ පෙනී සිටියහ.

නිදහසින් පසු සමාජ මනස මෙහෙය වූ අතීතය උත්කර්ෂයට නැංවූ ආඛ්‍යානය විසින් නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යයක් බිහිකිරීමේ පදනම් තම ක්ෂේත්‍රයන් තුළ විසිවන සියවසේදී සකස් කළ සැබෑ වීරයන් සහ වීරවරියන් යටපත් කර දමනු ලැබ ඇති අතර දූෂිත ප්‍රභූ පංතියේ ව්‍යාජ වීරයෝ ඉස්මතු කරනු

ලැබ සිටිති. නිදහසෙන් දශක හතකට පසුව කෘෂිකර්මය හා කාර්මීකරණය සංකලනය කළ ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයක් සහිත නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යයක් තැනීමේ වගකීම භාර ගැනීමට නියමිත ජාතික ජනබලවේගය ඉතිහාස ආඛ්‍යානයේ විසිවන සියවස ගැන සිදුවූ වැරැද්ද නිවැරදි කිරීම කාලෝචිත මැදිහත් වීමක් ලෙස හඳුනා ගනී. තවද විසිවන සියවසේ සැබෑ වීරයන් සහ වීරවරියන්ගේ නම් ඉතිහාස ලේඛනයේ සටහන් කිරීම හා ඔවුන්ගේ සාධනීය පරමාර්ථ හා ගෙවුණු සියවස තුළ මිනිස් සමාජය උකහාගත් නව්‍ය ආර්ථික, සමාජයීය, සංස්කෘතික වර්ධනයන් නූතන තත්වයන්ට සේම ලංකාවට ගැලපෙන ලෙස සකස්කර ගැනීම මේ දේශපාලන මොහොත තුළ කළ යුතු වැදගත් කාර්යයක් ලෙසට යෝජනා කරයි. අතීතයේ විශිෂ්ටත්වය සැමරීමට එහා ගොස් අතීතයට පමණක් අයිතිවාසිකම් කීමට ඇටවූ දූෂිත ප්‍රභූ උගුලෙන් ගැලවී නව ජාතික පුනරුද යුගයක් හරහා අතීතය වර්තමානය හා අනාගතය යන ත්‍රිත්වයම අත්පත් කර ගනිමු.

# අතීත විශිෂ්ටත්වය

අවුරුදු දහස් ගණනක අතීතයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව දියුණු රාජධානි ගණනාවක් වටා කේන්ද්‍රගත වුණු කෘෂිකාර්මික හා කාර්මික දියුණුවකින් යුත් රටක්ව පැවතිණි. මහා වැව්, කුඩා වැව්, හා ඒවා සම්බන්ධ කරන ඇළ මාර්ග පද්ධතියකින් සමන්විත සංකීර්ණ වාරි ජාලය රටේ කෘෂිකාර්මික සශ්‍රීකත්වයේ පදනමව පැවතිණ. කලාපයේ වෙනත් රටවල් අතර පැවති වාරි තාක්ෂණික දැනුම ඒ ඒ රටවලට ගලා ගෙන යාම හේතුවෙන්ද ලංකාව තුළම සිදු වූ වාරි තාක්ෂණයේ වර්ධනයන් හේතුවෙන්ද මුලදී සරල වාරි පද්ධතියක් ලෙස ආරම්භ වූ වාරි සංස්කෘතිය කාලයත් සමඟ දියුණු තත්වයකට පත් විය. දගැබ් වෙහෙර විහාර හා වෙනත් දැවැන්ත ඉදිකිරීම්වලින් සමන්විත නගර නිර්මාණය වූ අතර ඒ හා බැඳුණු ගම්මාන පද්ධතියක්ද සමඟ පැරණි රාජධානි බිහිවිය. එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමටද කෘෂිකාර්මික කටයුතුවල නිරත වීමටද නගර නිර්මාණයටද යුද කටයුතුවලටද අවශ්‍ය වූ විවිධ කර්මාන්තයන් සැලකිය යුතු මට්ටමේ දියුණුවක් අත්පත් කර ගෙන තිබිණි. යකඩ හා තඹ නිස්සාරණය දියුණු තත්වයක පැවති අතර යුගයට සාපේක්ෂ මහා පරිමාණ කර්මාන්තයන් විය. ලංකාවේ නිපද වූ තඹ නිර්මාණ අවට කලාපය තුළම භාවිත වූ අතර යකඩ භාවිතයෙන් නිපදවූ ඉහළ තත්වයේ වානේ භාණ්ඩ හා ආයුධ රට තුළ භාවිතයට ගනු ලැබුණු අතර අතිරික්තය අපනයනය කෙරිණි. තාක්ෂණය හා කලාව මිශ්‍රව පැවති අතීතයේ පිත්තල, රිදී, හා රනින් කළ නිර්මාණ සූක්ෂම ලෙස නිමවුණු ලෝහ භාණ්ඩ ලෙසද කලාත්මක නිර්මාණ ලෙසද භාවිත විය. ලංකාව නාවික

ගමනාගමනයේ කේන්ද්‍රීය ස්ථානයක ස්ථානගත වීම හේතුවෙන් ලෝකයට විවෘත වූ අතර තාක්ෂණික, සංස්කෘතික, ආගමික, දර්ශනික හා වෙළඳ හුවමාරු නිරන්තරයෙන් සිදුවිය. ඒ හේතුවෙන්ම ගොඩනැගුණු වරාය, තොටුපළ හා උප-තොටුපළ දිවයින පුරාම විසිර තිබූ අතර ඒවා දියුණු තත්වයේ පැවති රාජධානි හා නගර සමඟ සංකීර්ණ මාවත් පද්ධතියක් මඟින් යාව පැවතිණ. එහෙත් විද්‍යාවේ හා තාක්‍ෂණයේ දියුණුව මත පදනම් වූ මේ අතීත විශිෂ්ටත්වයේ ප්‍රතිඵල සමාජයේ ඉහළ සිට පහළට සාධාරණව බෙදී නොගිය අතර එකල පැවති දියුණු රාජධානි බිඳවැටීමත් සමඟ එම දියුණුවද ක්‍රමක්‍රමයෙන් අතුරුදන් වී ගියේය.

## ඉතිහාස රේඛාවේ බන්ධණය හෙවත් යටත්විජිත යුගය

ලංකාවේ පැවතියේ යුරෝපීය වැඩවසම් ක්‍රමයට සර්වසම නොවන එහෙත් වැඩවසම් ලක්ෂණද සහිත ආසියාතික නිෂ්පාදන රටාවක් සහිත රාජ්‍යයකි. පසුකාලීනව ලංකාවට සිදු වූ තීරණාත්මකම බලපෑම වූයේ බටහිර අධිරාජ්‍යවාදීන්ගේ යටත්විජිතයක් බවට පත් වීමය. එම යටත්විජිත ආක්‍රමණය හේතුවෙන් එතෙක් ලංකාව තුළ පැවති සමස්ත සමාජ දේහය උඩු යටිකුරු කිරීමකට බඳුන් විය. බටහිර අධිරාජ්‍යවාදීන් විසින් වතු ආර්ථිකය වටා මුළුමහත් සමාජයම ප්‍රතිසංවිධානය කරනු ලැබිණ. වතු ආර්ථිකය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා සහ යටත්විජිතය පාලනය කිරීමේ පහසුව වෙනුවෙන්ද මහාමාර්ග, දුම්රිය මාර්ග, විදුලි, යාන්ත්‍රික යටිතල පහසුකම් ව්‍යුහයන්ද රාජ්‍ය ආයතන ව්‍යුහයක්ද හඳුන්වා දෙනු ලැබිණ. යටත්විජිත පාලනයේ දේශීය කාර්යයන් ඉටුකරනු පිණිස ඇවැසි වෘත්තීය ශ්‍රම හමුදාව ගොඩනැංවීම සඳහා විධිමත් අධ්‍යාපන ක්‍රමයක් හා ආයතන ව්‍යුහයක්ද ගොඩනංවනු ලැබිණ. මේ දැවැන්ත සමාජ පරිවර්තනය හමුවේ සිදු වූ තවත් තීරණාත්මක වෙනසක් නම් අවුරුදු හාරසිය පනහක බටහිර පාලනය තුළ එම පාලකයින් හඳුන්වා දුන් යටත්විජිත සම්බන්ධතා හා ආර්ථිකය මත යැපුණු දේශීය ප්‍රභූ පංතියක් බිහිවීමයි.

## නිදහසින් පසු ලංකාව සම්බන්ධ යටත්විජිතවාදී වුවමනාව

යටත්විජිත සමය තුළ හඳුන්වා දුන් සමාජ පරිවර්තනය එක්තරා දුරකින් ඔබ්බට යහපත් දිශාවකට ගමන් නොකර වීමට යටත්විජිතවාදීහු වගබලා ගත්හ. වතු ආර්ථිකය පවත්වාගෙන යාමට සහ යටත්විජිතය පාලනයට අවශ්‍ය යටිතල පහසුකම් යම් ප්‍රමාණයකට ගොඩනැගූවද යටත්විජිත වුවමනාව වූයේ 1948දී

ඇති වූ නිදහසින් පසුවත් අප තාක්ෂණික දියුණුව අත්පත් කර නොගත් සංවර්ධනය නොවූ රාජ්‍යයක් ලෙස පැවතීමය. යටත්විජිතවාදී රාජ්‍යයන්ගේ දියුණුවට අවශ්‍ය පහසුකම් සපයන කලාපයක් ලෙස පවත්වා ගැනීමය. අතීත විශිෂ්ටත්වය හා ශ්‍රී විභූතිය ස්මරණය කරමින් තම ජාතික අභිමානය අතීතයට සීමාකර ගත් ජනතාවක් ලෙස අඛණ්ඩව පැවතීමය. වෙනත් වචන වලින් පවසන්නේ නම් එම යටත්විජිතයේ අතීතයේ අයිතිය යටත්විජිතයටම පවරමින් වර්තමානයේ සහ අනාගතයේ අයිතිය යටත්විජිතවාදීන් ලෙස ඔවුන් වෙතම තබා ගැනීමය; යටත්විජිත ජනයා අතීතකාමයක සිරකර තැබීමය. එසේ සිරකරනු ලැබූ ජනතාවගේ අභිමානයේ තවදුරටත් ඇති විය හැකි තුවාල සමනය කරනු වස් අතීත විශිෂ්ටත්වය පිළිබඳ කතිකාව ශක්තිමත්ව ගොඩනැංවීමට යටත්විජිතවාදීන්ගේ මැදිහත්වීම්ද දායක කරගනු ලැබිණි. ඒ වන විට නටඹුන් බවට පත්ව කැලෑ වැදී තිබූ මහා වැව්, දගැබ් හා වෙහෙර විහාර පිළිසකර කිරීම් පාවිච්චියට ගනිමිනි. ඒ හා සමාන්තරව යටත්විජිත සමය තුළ බෙදා වෙන්කර පාලනය කරනු ලැබූ සිංහල, දෙමළ හා මුස්ලිම් ජාතීන් නිදහසින් පසුවද ඒ ලෙසම බෙදා වෙන්වුණු ජාතීන් ලෙස පවත්වාගැනීමත් යටත්විජිතවාදීන්ගේ අභිලාෂයන්ට එරෙහිව කාර්මික අතින් සංවර්ධිත සමාජයක් පරිකල්පනය නොකරන හික්මවනු ලැබූ යටත්විජිත ගැති දේශීය ප්‍රභූ පංතියක් වෙත නිදහසෙන් පසු බලය මාරු කිරීමත් යටත්විජිතවාදීන්ගේ අපේක්ෂාව විය.

## නිදහස ලැබූ යටත්විජිතයන්ට තෝරා ගැනීමට තිබූ මාවත් දෙක

ජාතිකවාදය පිළිබඳ න්‍යායික කතිකාව තුළ ජාතියක් ගොඩනැංවීම පිළිබඳ කෙරෙන පැහැදිලි කිරීම වන්නේ එම ජාතියේ සාමාජිකයින්ට තමන්ගේ පොදු බව පිළිබඳව වන අදහසක් හා එම කණ්ඩායමට අයිතිවාසිකම් කිව හැකි භූමියක් තිබීම යන ප්‍රධාන කොන්දේසි දෙක සම්පූර්ණව තිබීමය. ජාතියකට තමන්ගේ පොදු බව ගැන පරිකල්පනයක්, අදහසක් ඇති කර ගැනීම සඳහා වන මාවත් දෙකක් ගැන ජාතිකත්වය පිළිබඳ න්‍යායික කතිකාවේ සඳහන් වේ. එකක් අතීතය දෙස ආපසු හැරී බලමින් එම ජාතියට අයත් අතීත කතාව තුළ කියවෙන ස්වර්ණමය යුගයක් සිහිපත් කරමින් හා එම අතීතය තුළ ජීවත් වූ වීරයින් සමරමින් තමාගේ පොදු බව ගැන අදහස පවත්වාගෙන යාමය. එසේත් නැතිනම් බෙදා වෙන්කර තැබීමට ලක් වූ එතෙක් වෙන් වෙන් වශයෙන් පැවතුණ ජාතීන් එක්ව තමන් විසින්

ගොඩනැගීමට නියමිත පොදු අනාගතයක් වෙනුවෙන් නව පොදු ජාතියක් ලෙස පරිකල්පනය මෙහෙය වීමය. නිදහසින් පසු බලය හිමි කරගත් ලාංකේය දූෂිත පංතිය විසින් තෝරාගනු ලැබුවේ මින් පළමු මාවතයි.

## ලාංකේය ප්‍රභූ පාලක පංතිය

ලාංකේය ප්‍රභූ පංතිය යනු බටහිර යටත්විජිත ආර්ථිකය මත දැඩි සේ යැපුණු එම ආර්ථිකයේ ප්‍රතිලාභ පංගුවක් තම පැවැත්ම කරගත් බටහිර යටත්විජිතවාදීන් විසින් තම කැමැත්තෙන්ම රාජ්‍ය බලය ලබා දුන් සුරතලුන් පිරිසකි. ලාංකේය ප්‍රභූන්ට බටහිර යටත්විජිතවාදීන්ට එරෙහිව නිදහස් අරගලයක් කිරීමේ අවශ්‍යතාවක් නොතිබිණි. එලෙසම අප හිස මත කඩා වැටුණු නිදහසින් පසු නවීන ශ්‍රී ලාංකේය ජාතියක් සහ රාජ්‍යයක් ගොඩනැගීමේ අවශ්‍යතාවක්ද ඔවුනට නොතිබිණ. යටත්විජිත ආර්ථිකයේ කලාපයක් වූ එංගලන්තයෙන් ආනයනය කළ භාණ්ඩ හා සේවාවලට අභියෝග කරන දේශීය ආර්ථිකයක් ගොඩනංවා බ්‍රිතාන්‍යයන් සමග ගැටුමට යාමේ අවශ්‍යතාවක් ඔවුනට නොවීය. යටත්විජිත ආර්ථිකය සැකසී තිබුණේ අපේ සම්පත් අමු ද්‍රව්‍ය ලෙස යුරෝපය වෙත අපනයනය කර ඔවුන්ගේ කාර්මික නිෂ්පාදන පද්ධතීන් තුළ නිමි භාණ්ඩ බවට පත්කිරීම මගින් යටත්විජිත හිමියන්ට ලාභය සංකේන්ද්‍රණය කිරීම වෙනුවෙනි. ඒ වෙනුවෙන් එම නිමි භාණ්ඩවල වෙළඳපළක් බවට ලංකාව පත්කර තිබිණ. යටත්විජිත ආර්ථිකයට එරෙහිව දේශීය නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැංවීම සඳහා විශිෂ්ට පදනමක් සැපයූ ඇබර්ඩීන් - ලක්ෂපාන ජලවිදුලි ක්‍රමය යටත්විජිතවාදීන්ගේ විවිධ කෙනෙහිලි මධ්‍යයේ අවම වශයෙන් අවුරුදු 25 කින් පස්සට යද්දී එම යෝජනා ක්‍රමය වහා ක්‍රියාත්මක කිරීමේ ඉල්ලීම වටා ගොඩනැංවිය හැකිව තිබූ ලාංකේය නිදහස් අරගලය ශක්තිමත් කොට ජයග්‍රහණයක් කරා ගෙන යාමට ලාංකේය දූෂිත පංතිය මැදිහත් නොවීය. ශ්‍රී ලාංකේය නිදහස් අරගලය ගමන් කළ උපරිම දුර වූයේ අවම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා කළ මැදිහත් වීමයි. ලංකාවට පූර්ණ නිදහස දිනාගත යුතු යැයි යෝජනා වූ විට එවකට සිටි ඩී.එස්.සේනානායක වැනි නායකයන් රැසක් විරුද්ධ වූහ. යටත්විජිතවාදීන්ගේ බස වහරමින් ඔවුන්ගේ චාරිත්‍රවාරිත්‍ර හා හැසිරීම් අනුකරණය කරමින් ඔවුන් හා සම තත්වයේ අසුන් ගැනීම මෙම ප්‍රභූ පංතියේ අපේක්ෂාව විය.

# නිදහසින් පසු ලාංකේය ප්‍රභූ පාලක පංතියේ දේශපාලන සංස්කෘතිය

අනාගතවාදී නවීන ශ්‍රී ලංකාවක් පිළිබඳ කිසිදු අදහසක් නොතිබූ දූෂිත පාලක පංතිය තම දේශපාලන බිම ලෙස තෝරා ගන්නේ ඉපැරණි රජ කාලයේ තිබූ ශ්‍රී විභූතියක් ගැන වර්ණනා කෙරෙන අතීතකාමීත්වයක ලාංකේය ජනයා සිර කරමින් ඒ අතීත සෞභාග්‍යය නැවත අත්පත් කරගැනීමේ ගමනක ජනතා 'වීරයින්' ලෙස පෙනී සිටීමයි. ප්‍රභූ පංතියේ පිරිමින් සුදු පැහැති ජාතික ඇඳුම් සහ කුරහන් සාටක වැනි ව්‍යාජ සළු පිළි පොරවා ගත්හ. පූර්ව යටත්විජිත යුගයේ ගැහැනුන් විසින් භුක්තිවිඳි සාපේක්ෂ ලෙස නිදහස් ජීවන රටා වෙනුවට වික්ටෝරියානු සංස්කෘතිය මුසු නව ජාතිකත්වයක් පිළිබඳ අදහසක් නිර්මාණය කරමින් ස්ත්‍රීතික යැයි හඳුන්වා ගත් සංස්කෘතියක් පවත්වාගෙන යාමේ සම්පූර්ණ බර ගැහැනුන් වෙත පටවන ලදී. කුල හා ජනවර්ග ලෙස ජනයා තවදුරටත් බෙදා වෙන්කෙරුණු අතර මැතිවරණ දේශපාලනයේ ප්‍රධාන භූමිකාවක් කුලවාදයන් හා ජාතිවාදයන් විසින් ඉටුකරන ලදි. කාර්මීකරණයක් පිළිබඳව කෙරුණු හුදෙකලා කෙටි කාලීන මැදිහත් වීම් කිහිපයක් හැරුණු කොට කෘෂිකාර්මික රාජ්‍යයකින් ඔබ්බට කාර්මීකරණයේ දිශාවේ තීරණාත්මක අධිෂ්ඨානශීලී ගමනකට තබනු ලැබූ කිසිදු පියවරක් නොවීය. රැවටිල්ල හා බොරුව පශ්චාත් නිදහස් ප්‍රභූ දේශපාලනයේ තීරණාත්මක සාධකයක් විය. ව්‍යාජ විකල්පයන් දෙකක් ලෙස පෙනී සිටි වෙස්වළා ගත් ප්‍රභූ පාලක පංතිය කිසිදු ඉටු නොකළ මැතිවරණ පොරොන්දු දේශපාලනයක් මගින් මාරුවෙන් මාරුවට බලයට පත්වූහ.

මුලදී පවුල් කිහිපයක් වටා බලය කේන්ද්‍ර වූ පවුල්වාදයක් ලෙස ක්‍රියාත්මක වූ ප්‍රභූ දේශපාලනය ක්‍රම ක්‍රමයෙන් කූට ව්‍යාපාරිකයින් හා දූෂිත නිලධාරීන්ද එක් කරගත් බලය අති විශාල ලෙස කේන්ද්‍ර කරගත් ප්‍රභූ කේන්ද්‍රීය කල්ලි දේශපාලනයක් කරා වර්ධනය විය. පහළ ගම් මට්ටමේ සිට දේශපාලන බල පිරමීඩයේ ඉහළම තැන දක්වා දේශපාලන යන්ත්‍රය ක්‍රියාත්මක වන ප්‍රධානම හේතු සාධකය බවට දූෂණය පත් විය. 1977දී නව ලිබරල්වාදය තුළ විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමග සේවා ආර්ථිකයක දිශාවට යම් ගමනක් ඇරඹුවද ඉහවහා ගිය දූෂණය හමුවේ සිදු වූයේ නිෂ්පාදන ආර්ථිකයක් යම් ප්‍රමාණයකට හෝ ගොඩනැගිය හැකි ජාතික සම්පත්, දූෂිත ගනුදෙනු මගින් කුණුකොල්ලයට විකුණා දැමීමය. දූෂිත දේශපාලනය විසින් කුළු ගැන්වුණු ජාතීන් අතර

අසමගිය තිස් අවුරුදු යුද්ධයක් කරා රට තල්ලු කරනු ලැබිණ. යටත්විජිතවාදයෙන් ලැබුනු නිදහස දූෂිත ප්‍රභූ දේශපාලනය විසින් අර්ථ විරහිත විකාරයක් කරනු ලැබූ අතර නිදහස ලැබූ අනෙක් සමහර රාජ්‍යයන්හි මෙන් නූතන ඉදිරිගාමී සමාජයක් හෝ සක්‍රීය පුරවැසියෙක් බිහි නොවුණි. නිදහසින් පසුවද පොදුවේ දක්නට ලැබුණේ අඩු වැඩි වශයෙන් පසුගාමීත්වය තුළ සිර වූ ප්‍රභූ පංතිය සමග නිවට දේශපාලන සම්බන්ධයක් පවත්වන වැඩවසම් චින්තනයෙන් යුතු සමාජයකි. 1977 පමණ ආරම්භ වූ දේශපාලනය පාදඩකරණය 2000 ගණන් වන විට උපරිමයට ළඟා විය. නීතියේ ආධිපත්‍යය කඩා වැටුණු අතර රාජ්‍ය හා පරිපාලන සේවාවල ස්වාධීන ක්‍රියාකාරිත්වය දුර්වල කරමින් ප්‍රභූ පාලක පැලැන්තියේ දේශපාලන වුවමනාව මත හැසිරෙන ව්‍යුහයන් බවට ඒවා පත්කරන ලදී. මෙම අන්ත දූෂිත දේශපාලනයේ කූටප්‍රාප්තිය 2022 දී ණය බරින් ගිලුණු බංකොලොත් රාජ්‍යයක් බවට පත්වීමෙන් සනිටුහන් කෙරිණ. විකල්ප කණ්ඩායම් දෙකක් ලෙස සළු පිළි හැඳ අවුරුදු 76ක් බලය මාරුවෙන් මාරුවට හෙබවූ ප්‍රභූ කල්ලි දෙකෙහි ව්‍යාජ වෙස් මාරුව 2022න් අවසන් වූ අතර ඒ කල්ලි දෙක දෙකක් නොව එකක් බවට බංකොලොත් ශ්‍රී ලංකාව තුළ දෙගිඩියාවකින් තොරව සමාජ ගත විය.

## විසිවන සියවසේ ඓතිහාසික වැදගත්කම

නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යය ගොඩනැගීමේ කිසියම් විභවයක් සලකුණු කළ විසිවන සියවස, ගෝලීය වශයෙන් අතිශය වැදගත් සියවසක් විය. එය ලෝක ඉතිහාසය තුළ තීරණාත්මක සංධිස්ථානයක් වශයෙන් නම් කළ හැකිය. ඇත්තෙන්ම, 14 සියවසේ සිට 19 සියවස දක්වා යුරෝපියානු පුනරුදයේ හා ප්‍රබුද්ධත්වයේ චින්තකයන්, දේශපාලකයන්, විද්‍යාඥයන්, කලාකරුවන්, විසින් පරිකල්පනය කළ ලෝකය සීඝ්‍රයෙන් භෞතිකව ගොඩනැගෙන්නේ විසිවන සියවස තුළය. එම නිසාම එය කොන්දේසි විරහිතව නව්‍යත්වය පිළිබඳ අනුරාගයකින් බැඳුණු යුගයක් විය. පුද්ගලයන් සහ රාජ්‍යය අතර සම්බන්ධය නව සමාජ ගිවිසුමකට අනුව සකස්වී සියලු පුරවැසියන්ගේ කැමැත්තට අනුව පාලකයන් තෝරා පත්කර ගැනීම ඇරඹෙන්නේ විසිවන සියවසේදීය. සෑම මිනිසෙකුගේම කැමැත්ත සේම සෑම මිනිසෙකුගේම පැවැත්ම නියෝජනය වීමේ වැදගත්කම මින් පෙර කිසිදු සමාජ සැකැස්මකදී මෙලෙස අවධාරණය වූයේ නැත.

පාරම්පරිකව සුවිශේෂී ලේ උරුමයකට සහ දිව්‍යමය කැමැත්තකට අනුව ගමන් කළ රාජ්‍ය පාලනයේ අයිතිය අවසන් වී පොදු සමාජ සම්මුතියකට අනුව ජනතාව පිළිගන්නා නියෝජිතයන් අතින් ජනතාවගේ අනුමැතිය අනුව පාලනය වීම ඇරඹීම එම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාද ආකෘතියේ ඇති විවිධ අඩුපාඩුකම් මධ්‍යයේ පවා සමාජ දේශපාලන ඉතිහාසයේ තීරණාත්මක පිම්මක් විය. යටත්වැසියන්ගේ යුගය අවසන් වී නූතන දේශපාලනය තුළ තම භූමිකාවේ වැදගත්කම වටහාගත් පුරවැසියන්ගේ යුගය නිර්මාණය විය. එසේම විසිවන සියවස යටත්විජිතවාදයේ අවසානය දුටු සියවසයි. තාක්‍ෂණයේද වෛද්‍ය විද්‍යාවේද කෘෂි කර්මාන්තයේද ඉදිරි පිම් සනිටුහන් කළ කාලයයි. සාහිත්‍යයේද කලාවේද සංගීතයේද විප්ලවීය වෙනස්කම් සිදු වූ සංස්කෘතික පුනරුදයක් ඇති වූ අවධියයි. විධිමත් අධ්‍යාපනය විශාල ලෙස පැතිරුණු යුගයයි. මේ වකවානුව තුළ නූතනත්වයේ මූලික හරයන් වූ මානව හිමිකම්, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ඉදිරිගාමී අදහස් පුළුල් ලෙස සමාජ ගත විය. සමාජ සාධාරණත්වය හා සාමූහිකත්වය පිළිබඳ වූ වටිනාකම් බොහෝ සමාජ මැදිහත්වීම්වල පදනම විය. විසිවන සියවස මුල භාගයේදී සිදුවූ රුසියානු විප්ලවය මුළු ලෝකය තුළමත්, විශේෂයෙන් ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකා රටවලත් විද්‍යා, තාක්‍ෂණ හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමට විශාල බලපෑමක් ඇති කෙරිණි.

## විසිවන සියවස ලාංකේය ඉතිහාසයේ හිඩැසක් වන්නේ ඇයි?

විසිවන සියවස ලාංකේය සන්දර්භය තුළද විචිත්‍රවත් එකකි. බටහිර යටත්විජිතවාදීන්ට එරෙහිව ජාතික නිදහස් අරගලය තීව්‍ර කළ හැකිව තිබූ, යටත්විජිතවාදීන් විසින් ගොඩනැගීම දිගින් දිගටම කල්තැබූ ලක්ෂපාන ජලවිදුලි යෝජනා ක්‍රමය වහා ක්‍රියාත්මක කිරීමේ සටන් පාඨය රැගත් තාක්ෂණික සටන් භූමිවලින්ද සිංහල දෙමළ මුස්ලිම් බෙදුණු ජාතීන් වෙනුවට ලාංකේය ජාතිය ගොඩනැංවිය හැකි විභවයන්ගෙන්ද වැඩවසම් පන්නයේ සමාජයක සිට නූතනත්වය කරා පා තැබිය හැකි අධ්‍යාපනය, තාක්‍ෂණය, ගෘහ නිර්මාණ ශිල්පය, වෛද්‍ය විද්‍යාව, සාහිත්‍ය, නාට්‍ය, සංගීතය, චිත්‍ර, අධ්‍යයන පර්යේෂණ අයිතිවාසිකම වැනි විවිධ ක්ෂේත්‍ර තුළ වූ වෘත්තිකයන්, පුරවැසියන් මෙන්ම වෘත්තීය සමිති, කාන්තා සංවිධාන හා වමේ ව්‍යාපාරයද කළ මැදිහත්වීම්වලින්ද ගහන වූ විසිවන සියවස ලාංකේය ඉතිහාස ආඛ්‍යානය තුළ නිවැරදිව සටහන්ව නැතිවීම නිදහසින් පසු අවුරුදු 76 බලය හෙබ වූ

ලාංකේය ප්‍රභූ දූෂිත පංතියේ දේශපාලන න්‍යාය පත්‍රය සමග කදිම ලෙස ගැළපුණි. ලාංකේය සමාජය අතීත සෞභාග්‍යය පිළිබඳ කතිකාවක සිරකර තැබුණු අතර නූතන ලාංකේය රාජ්‍යයක් පිළිබඳ සහ සක්‍රීය පුරවැසි සමාජයක් පිළිබඳ ජනතාවගේ පරිකල්පන ඉඩකඩ අවුරා දැමිණි. කාර්මීකරණයක් හා නිෂ්පාදන ආර්ථිකයක් පිළිබඳ අදහස් සමාජය තුළ සංසරණය නොවූ අතර අනුරාධපුර පොළොන්නරු යුගයන් කරා පිටුපසට යන ගමනක දුටුගැමුණු, පරාක්‍රමබාහු, විහාරමහා දේවී චරිත ලෙස වෙස්ගත් දූෂිත ප්‍රභූ දේශපාලන පංතිය මැතිවරණ දේශපාලනය තුළ අතීතකාමයේ ගිලුනු ජනයා ගේ වීරයින් බවටපත් වෙමින් නැවත නැවතත් බලයට පත්වූහ.

විසිවන සියවස තුළ ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමට අවැසි වැදගත් මැදිහත් වීම් කළ සිංහල, දෙමළ හා මුස්ලිම් පුරවැසියන් ගැන පාසල් පෙළ පොත්වල සඳහන් වුවද ඒ අදාළ බරින් නොවේ. ඔවුන් ගැන සඳහන් වූයේ ඒ ඒ ක්ෂේත්‍රයන් තුළ නිර්මාණශීලී මැදිහත්වීම් කළ පුරවැසියන් යන සීමාව තුළය. ඒ විවිධාකාර මැදිහත්වීම් තුළ දේශපාලන වැදගත්කම විස්තර කරමින් එම මැදිහත්වීම්වලින් ආභාසය ලබා නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යයක් ගොඩනංවනු පිණිස ජනයා තීරණාත්මක ලෙස පොළඹවන බරකින් නොවේ; විසිවන සියවසේ වීරයින් ලෙස ඔවුන් හඳුන්වාදෙන සංදර්භයක් තුළ නොවේ. පශ්චාත් නිදහස් ලංකාවේ වීරයින් හා වීරවරියන් ලෙස වැජඹුණේ නිදහස් දිනවල සැමරුණේ ලාංකේය සමාජය අතීතකාමයක හා පසුගාමීත්වයක සිර කළ අනුරාධපුර පොළොන්නරු යුගයන් කරා ව්‍යාජ චාරිකා ගැන සිහින බිහි කළ දුටුගැමුණු, පරාක්‍රමබාහු, විහාරමහා දේවිය ලෙස වෙස්වළා ගත් දේශීය දූෂිත ප්‍රභූ පාලක පංතියයි.

# විසිවන සියවස: අත්හරින ලද සැබෑ උරුමය වටහාගැනීම

විසිවන සියවසේ තීරණාත්මක මැදිහත්වීම් කළ වීරයින් හා වීරවරියන්ට තමන්ටම ආවේණික වූ ලක්ෂණ ඇති අතර ඔවුන් සියල්ලන්ම පාහේ අඩුවැඩි වශයෙන් ප්‍රකට කළ පොදු ලක්ෂණද ගණනාවකි. එම පොදු ලක්ෂණ ඔවුන් විසින් ගොඩනැගීමට අපේක්ෂා කළ නූතනත්වයේ මූලික මූලධර්ම පැහැදිලි කරයි.

## 1. මැදිහත්වීම්වල වැදගත් බව

ඉහත නම් කළ හා නොකළ ක්ෂේත්‍ර බොහොමයක අනාගතවාදී මැදිහත්වීම් සිදුකළ වීරයින් හා වීරවරියන් ගණනාවක් සිටියද ඉන් සමහරු තීරණාත්මක මැදිහත්වීම් කළ අයයි. අප ජීවත්වන වත්මන් පොළොවේ නූතනත්වය පැළ කළෝ ඔවුහුය. ඒ ඒ ක්ෂේත්‍ර තුළ ඔවුන් සිදුකළ දයකත්වයන් සමාජය තුළ පුළුල් කතිකාවන් නිර්මාණය කිරීමට දයක විය.

## 2. ප්‍රභූවාදී ප්‍රවේශයකින් පොදු මහජන ප්‍රවේශයක් වෙත මාරු වීම

මේ වීරයෝ හා වීරවරියෝ තමන් මැදිහත් වෙමින් තිබූ ක්ෂේත්‍රයන්හි තිබූ ප්‍රභූ පංතිය කේන්ද්‍ර කරගත් ප්‍රවේශයක සිට සාමාන්‍ය පොදු ජනයා ඉලක්ක කර ගත් ප්‍රවේශයකට මාරු වූහ. බටහිර යටත්විජිතවාදීන්ට ලාභ ගෙන දුන් ආනයනික බල ශක්තිය වෙනුවට දේශීය අඩු වියදම් බල ශක්තියකට මාරු වීමේ ඉඩකඩ, ප්‍රභූ පංතියේ රුචිකත්වයට ගැළපුණු ගෘහ නිර්මාණ ශිල්පයෙන් විතැන්ව පොදුජන සම්ප්‍රදය නිර්මාණශීලී ලෙස භාවිතයෙන් ගෘහ නිර්මාණය, මිල අධික සමාගම් නාම යටතේ නිර්දේශ වූ ඖෂධ ප්‍රතිපත්තියක සිට සාමාන්‍ය ජනයාට පහසුවෙන් ලබාගත හැකි මූලික ඖෂධ නාම භාවිත කරන ඖෂධ ප්‍රතිපත්තියකට මාරුවීම, ප්‍රභූ පංතිය වෙත ඉලක්ක වූ කාවයකින් කෙරෙන සමාජ පර්යේෂණවලින් ඉවත්ව වැඩ කරන ජනයා පර්යේෂණ ඉලක්කයක් බවට පත්කර ගැනීම, ප්‍රභූ සමාජයෙන් ගැලවී පොදු ජන ජීවිතය සාහිත්‍යකරණයේ නව කලාපය ලෙස පරිශීලනය, නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හඳුන්වාදීම වැනි මැදිහත්වීම් මේ ප්‍රවේශයන්ගේ මාරුව ගැන වූ උදහරණ වේ.

## 3. වැඩවසම් ලක්‍ෂණ සහිත ආසියාතික රාජ්‍යය වෙනුවට නූතන රාජ්‍යයක් හා යටත්වැසියෙකු වෙනුවට පුරවැසියෙකු නිර්මාණය කිරීමේ පදනම සැකසීම

බාහිර ලෝකය සමග ගනුදෙනු කළ මොවුනගේ මැදිහත්වීම්වල ඉලක්ක ගත කණ්ඩායම පොදු ජනයා වූවා සේම එම මැදිහත්වීම් මගින් පොදු ජන සමාජයේ තිබූ වැඩවසම් ස්වභාවය යම් ප්‍රමාණයකට වෙනස් කිරීමටද රුකුලක් විය. ඒ මැදිහත්වීම් වටා ගොඩනැගුණු කතිකා තුළ ප්‍රභූ පංතියේ සමාජ ස්වරූපය අඩු වැඩි වශයෙන් හෙළිදරව් වූ අතර ජනයා තුළ තමන් ගැන වූ වැදගත්කම ඉහළ දැමීමටද හේතු විය. වැඩවසම් පන්නයේ රාජ්‍යයේ ස්වභාවය යම් පමණකට වෙනස් කරමින් නූතන රාජ්‍යයක ගති ලක්ෂණ ප්‍රකට කිරීමටද මෙම මැදිහත්වීම් දායක විය. අධ්‍යාපනයේ හා සෞඛ්‍ය සේවාවේ පැතිරීමත් සමග සාහිත්‍ය කලාව නාට්‍ය සංගීතය වැනි ක්ෂේත්‍රයන් තුළ ඇති වූ නවීනත්වය වඩා ගැඹුරින් සමාජගත වීමට හේතු කාරක විය. මෙම මැදිහත්වීම් ප්‍රභූ පංතියේ පසමිතුරුතාව හේතුවෙන් සමස්ත සමාජයම නූතනත්වය දෙසට ගමන් කරවීමට අසමත් වුවද ප්‍රගතිශීලී පුරවැසි සමාජය සැලකිය යුතු ප්‍රමාණයකින් පුළුල් කිරීමට සමත් විය.

## 4. නූතනත්වය අතීත සම්ප්‍රදාය සමග මුසුකිරීම

මොවුනගේ මැදිහත්වීම් පූර්ව යටත්විජිත සමයත් යටත්විජිත හා පශ්චාත් යටත්විජිත සමයන් අතර ඇති තිබූ තීරණාත්මක ඛණ්ඩනය බොඳ කිරීමට යම් දුරකට සමත් විය. ඒ නවීනත්වය පූර්ව යටත්විජිත සමයේ ප්‍රගතිශීලී ජන මැදිහත් වීම්වල ලක්ෂණ හා සම්ප්‍රදායන් සමග මුසු කිරීමෙනි. ඒ අර්ථයෙන් ඔවුහු දේශීයත්වයෙන් සම්පූර්ණයෙන්ම බැහැර වූ අන්තර්ජාතිකවාදීන් හෝ බාහිර ලෝකය ගැන අසංවේදී වූ තමන් ගේ කුඩා ලෝකයක් තුළ සිර වූ අය හෝ නොවූහ. ඔවුන් අපට පරිකල්පනයට යෝජනා කළ නූතන රාජ්‍යය දේශීයත්වය හා මුසු වූ නූතන සමාජයකි.

## 5. සමාජ ක්‍රියාකාරීත්වය සමාජ සාධාරණත්වය මත පදනම් වූ සාමූහික ව්‍යායාමයක් ලෙස

ලාංකේය ප්‍රභූ පංතියේ පැවැත්ම සහතික කළ උපායමාර්ගයක් වූයේ යටත්විජිත සමයේද භාවිත කළ බෙදා වෙන්කළ පාලනය තවදුරටත් තීව්‍ර කරමින් තනි හුදෙකලා පුද්ගලිකත්වයක් දක්වා ගෙන යාමයි; ඒ මගින් වඩා හුදෙකලා පුද්ගලයින්ගෙන් සැදි වැඩවසම් පන්නයේ සමාජයේ ගැලවුම්කරුවන් ලෙස පෙනී සිටීමයි. මීට ප්‍රතිපක්ෂව විසිවන සියවසේ සැබෑ වීරයෝ හා වීරවරියෝ සමාජය සමාජ සාධාරණත්වය මත පදනම් වූ සාමූහික උත්සාහයක් ලෙස තම තමන් මැදිහත් වූ ක්ෂේත්‍ර තුළ පරිකල්පනය කළහ.

## 6. ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැංවීමේ විභවය

මේ මැදිහත්වීම් තුළ බෙදුණු ලංකාවක් වෙනුවට සියලු ජාතීන් ශ්‍රී ලාංකේය සෙවණක් යටතට ගෙන ඒමේ විභවයක් අඩු වැඩි වශයෙන් ඇතුළත් විය. එම මැදිහත්වීම්වල සාරය වූයේ එකිනෙකා කෙටවීම හෝ බෙදීම නොව සමාජ සේවාවන් හා ඒවායේ ප්‍රතිලාභයන් පොදුවේ සමස්ත සමාජය වෙතම ගලාගෙන යාමට සැලැස්වීම මගින් සියල්ලන් එකමුතු කිරීමය.

## 7. කෘෂිකාර්මික සමාජයක සිට නිෂ්පාදන ආර්ථිකයක් කරා ගමන් කිරීමේ විභවය

මෙම සියලු මැදිහත්වීම්වල පොදු ලක්ෂණයක් වූයේ ලංකාව පිළිබඳ ඉතිහාස ආඛ්‍යානයෙන්, ඒ අතීත කෘෂිකාර්මික ශ්‍රී විභූතිය පිළිබඳ කතිකාව තුළ සිරවීමෙන් ගැලවී ඉදිරිගාමී සමාජයක් පරිකල්පනය කිරීමට තිබූ හැකියාවයි. ඒ ගැලවීම හේතුවෙන් ඉදිරි සාමූහික සමාජයක දියුණු ඵලයක් වන නිෂ්පාදන ආර්ථිකයක් ගැන පරිකල්පනයට ඉඩ විවර වීමය.

# විසිවන සියවස: සැබෑ වීරයන් සහ වීරවරියන් හඳුනා ගැනීම

ඉහත විස්තර කරන ලද විසිවන සියවසේ අත්හරින ලද සැබෑ උරුමයේ වැදගත්කම තවදුරටත් වටහා ගනු පිණිස එකී සුවිශිෂ්ට චරිත කිහිපයකගේ මැදිහත්වීම් විමසා බලමු.

## ඩී.ජේ. විමලසුරේන්ද්‍ර (1874 - 1953)



ලංකාව මෙතෙක් බිහිකළ විශිෂ්ටතම ඉංජිනේරුවරයා විමලසුරේන්ද්‍ර ලෙස විවාදයකින් තොරව නම් කළ හැකිය. ඒ දැනට අපට ඔහුව හඳුන්වාදී ඇති ලංකාවට ජල විදුලිය හඳුන්වා දුන් “ජල විදුලියේ පියා” යන අර්ථයෙන්ම නොව, එකල රටේ තිබූ බලශක්ති ඉල්ලුම අභිබවා ගිය අතිවිශාල ජල විදුලි බලශක්ති විභවයක් හඳුනා ගනිමින් ඒ අතිරික්ත විදුලිය පාවිච්චියෙන් කාර්මික අතින් දියුණු සංවර්ධිත පශ්චාත් යටත්විජිත නිදහස් ශ්‍රී ලංකාවක් පරිකල්පනය කළ ඉංජිනේරු පසුබිමක් ඇති ජාතික නායකයා වශයෙනි. ඔහු

විසින් 1920 හා 1930 ගණන් වල කළ ඒ කාර්යය සම කළ හැක්කේ ඉන්දියානු නායකයින් කාර්මික අතින් දියුණු නූතන ඉන්දීය ජාතියක් පරිකල්පනයක් වෙනුවෙන් කළ කාර්යයටය.

විමලසුරේන්ද්‍ර 1918 වසරේදී සිලෝන් ඉංජිනේරු ආයතනයේ වාර්ෂික සැසිවාරයේදී ආයතන සැසිවාර ඉතිහාසයේ ශ්‍රී ලාංකිකයෙකු ප්‍රථමයෙන්ම ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කරමින් කැලණි හා මහවැලි ගංගා වල ගැබ්ව ඇති සමස්ත ජල විදුලි ධාරිතාව ගැනත් දුම්රිය මාර්ග පද්ධතියේ යම් කොටස්වල දුම්රිය ධාවනය විදුලිකරණය කළ හැකි ආකාරය පිළිබඳවත් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළේය. 1920 ගණන් හා 1930 ගණන් වෙද්දී විමලසුරේන්ද්‍රගේ මෙම ආරම්භක අදහස් නූතන සංවර්ධිත ශ්‍රී ලංකාවක් හා ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනගන සවිස්තරාත්මක සැලැස්මක් දක්වා වර්ධනය විය. මුළු ලංකාව පුරාම පැතිර ඇති සියලු ඛනිජ හා වෙනත් සම්පත් ගැන පූර්ණ අධ්‍යයනයක යෙදුණු ඔහු එම සම්පත් භාවිතයෙන් කාර්මික හා කෘෂිකාර්මික දියුණුවක් අත්කරගත හැකි ආකාරය ගැනත්, ඒ දියුණුව සඳහා අවශ්‍ය වන ශ්‍රම සම්පත ගොඩ නැගීමට අවශ්‍ය අධ්‍යාපනය කවර ආකාර විය යුතුද යන්න ගැනත්, ඒ කාර්මීකරණ ක්‍රියාවලිය මෙහෙය වීමට අවශ්‍ය ආයතන ව්‍යුහය පිළිබඳවත් දීර්ඝ ලෙස කරුණු දැක්වීය.

ඇබර්ඩීන්-ලක්ෂපාන ජල විදුලි යෝජනා ක්‍රමය ඉදිකිරීම සුදු ආණ්ඩුව විසින් දිගින් දිගටම කල් තැබීම නිසා කලකිරීමට පත්වූ විමලසුරේන්ද්‍ර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුරෙන් ඉල්ලා අස්ව රාජ්‍ය මන්ත්‍රණ සභාවේ රත්නපුර ආසනයට තරග කර 1931-36 කාලයේ මන්ත්‍රීධුරය හෙබවූ අවධියේ කළ සියලු මැදිහත්වීම් කාර්මික අතින් දියුණු ශ්‍රී ලංකාවක් ගොඩ නැගීම සඳහාම වෙන්විය. ලාංකේය දූෂිත ප්‍රභූ පංතිය ඛේදනීය ලෙස මගහැර දමනු ලැබූ එහෙත් රටේ පොදු ජනයා අතර ආකර්ෂණය දිනාගත් ඇබර්ඩීන්-ලක්ෂපාන ජලවිදුලි බලාගාරය ඉක්මනින් ඉදිකර සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ අදහස බටහිර යටත්විජිතවාදීන්ට එරෙහි නිදහස් අරගලය ක්‍රියාත්මක කළ හැකිව තිබූ විශිෂ්ටතම ලාංකේය බිම විය. දශක තුනකට අධික කාලයක් ගතකොට 1950 දී විදුලි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන විට නිපදවන අතිරික්ත විදුලියෙන් නිෂ්පාදන ආර්ථිකයක් ඇති සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට තිබූ ඉඩකඩ අහෝසිව තිබිණ. අතීතකාමයක ගිලුණු ශ්‍රී ලංකාවක් වෙනුවට අනාගතවාදී නූතන ශ්‍රී ලංකාවක් 20 වන සියවසේදී ගොඩනැගීමට තිබූ 'විමලසුරේන්ද්‍ර-මොහොත' ඒ හේතුවෙන් අපට අහිමි විය.

# සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර (1884 - 1969)



අධ්‍යාපනය යනු රටක් නූතන සංවර්ධනයේ දිශාවට කැඳවාගෙන යන තීරණාත්මකම බලවේගයක්ය යන්න පිළිගත් සත්‍යය වුවත් රටක අධ්‍යාපනයට සියලු පුරවැසියන්ට සමාන ප්‍රවේශයක් නොලැබෙන්නේ නම් එහි ප්‍රතිඵල සීමාසහිත වන බව වටහා ගත් සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර යනු ලංකාවේ අනාගතය වෙනස් කිරීමට බරපතළ ලෙස දායක වූ සුවිශේෂී චරිතයකි. අධ්‍යාපනය විධිමත් ලෙස ජනවර්ගය, ආගම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජ ආර්ථික තත්වය යනාදී කරුණු මත වෙනස් නොවී සියලු පුරවැසියන්ට සමානව ලබාගත හැකි ලෙස නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සැකසීමට මූලික වන්නේ ඔහුය. ඒ අධ්‍යාපනය පිළිබඳ විධායක කමිටුවේ සාමාජිකයෙක් වූ අබේරත්න රත්නායක විසින් ගෙන එනු ලැබූ පෙර පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබාදීම පිළිබඳ යෝජනාව යථාර්ථයක් බවට පත්කිරීමට මූලික වීමෙනි. 1943 රාජ්‍ය සභාවේ අධ්‍යාපනය පිළිබඳ කමිටුවේ ප්‍රධානියා වූ ඔහු විසින් ඉදිරිපත් කරන යෝජනාවන් ඉදිරියේ බොහෝ දෙන වික්ෂිප්ත වූ බවද කියවෙයි. එසේම මෙයට ප්‍රතිචාර ලෙස නුදුරු අනාගතයේදී තමන්ගේ වත්තක පොල් ගෙඩියක් කඩා ගැනීමට කෙනෙකු සොයා ගැනීමට නොහැකි වනු ඇතැයි කියූ ඊනියා ජාතිකවාදී නායකයින් ගැන ඉතිහාසයේ කියවෙයි.

කන්නංගර විසින් ඉදිරිපත් කරන මූලික යෝජනාවලියට අනුව පෙර පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබාදීමේ කරුණට අමතරව ප්‍රාථමික පංතිවලදී මව්බසින් අධ්‍යාපනය ලබාදෙන අතර තුන්වන ශ්‍රේණියේ සිට ඉංග්‍රීසි ඉගැන්වීම ආරම්භ කෙරෙයි. එසේම විෂය නිර්දේශයන් සකස් කළ යුත්තේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හිස, හදවත සහ දෑත සංවර්ධනය කිරීම අරමුණු කරගෙනය. එනම් දරුවාගේ හැඟීම්, බුද්ධිය සහ ප්‍රායෝගික හැකියාවන් වර්ධනය කිරීම ඉලක්ක කරගෙනය. මෙම සමස්ත යෝජනාවලියේ මූලික අභිප්‍රාය වූයේ ජාතියට කල්පවත්නා වටිනාකමක් එක්කිරීමයි.

කේන්ද්‍රීය නගරවල ජීවත්වන දරුවන්ට සේම ඈත ගම් දනව්වල වෙසෙන දරුවන්ටද එකසේ අධ්‍යාපනයේ ප්‍රවේශය ලැබීම උදෙසා සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි මධ්‍ය මහා විද්‍යාල 54ක් ගොඩනැගීමටද යෝජනා කර ඇත්තේ යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම සහතික කිරීම වෙනුවෙනි.

මෙම නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති නිදහසින් පසු ලංකාවේ ස්වභාවය වඩා සුබදායක ලෙස පරිවර්තනය කිරීමට තීරණාත්මක ලෙස දායක වූ බව අවිවාදිතය. කන්නංගර චින්තනයේ ඇති සුවිශේෂීත්වය වන්නේ අධ්‍යාපනය කිසිදු වාර්ගික ආගමික හෝ පංති භේදයකින් තොරව සියලු පුරවැසියන්ට එකසේ ලැබිය යුතු අයිතියක් ලෙස අවධාරණය කිරීම තුළ පමණක් නොවේ. ඒ ඔස්සේ මෙම අනන්‍යතා සීමාවලින් ඔබ්බෙහි බිහි වන නූතන ශ්‍රී ලාංකේය ජාතියක් පිළිබඳව ඔහු සතු දැක්මද එම සුවිශේෂීත්වයේ වැදගත් ලක්ෂණයකි.

## හැන්ඩි පෙරින්බනායගම් (1899 - 1977)



විසිවන සියවස තුළ මුල් බැස ගන්නා ජාතිභේදවාදී ප්‍රවාහයන් අතර පෙරින්බනායගම් දෘෂ්ටිය දීප්තිමත් තාරකාවක් සේ අනාගත ශ්‍රී ලාංකේය ජාතියකට මඟ පෙන්වයි. ඔහු සේම ඔහු නායකයෙක් ලෙස දායක වන පුළුල් නූතන දැක්මක් සහිත යාපනය තරුණ කොන්ග්‍රසයත් සැලකිය හැකි වන්නේ ලංකාවේ ඉතිහාසය වෙනස් කළ හැකි තත්වයන් දරා සිටි නමුදු අපට අහිමි වූ විභවතාවයන් ලෙසය. විශේෂයෙන්ම උතුර සහ දකුණ ලෙස නොබෙදුණු, දෙමළ, මුස්ලිම්, සිංහල ලෙස නොබෙදුණු, කුල හෝ ආගම් ලෙස නොබෙදුණු ජාතියක් පරිකල්පනය කළ විසිවන සියවසේ මුල් යුගය තුළ අපට හමුවන සංවිධාන කිහිපයෙන් එකක් ලෙස යාපනය තරුණ කොන්ග්‍රසය සැලකිය හැකිය. වරක් කොල්වින් ආර්. ද සිල්වා පවසන ආකාරයට ලංකා සමසමාජ පක්ෂයේ මූලයන්ටද යාපනය තරුණ කොන්ග්‍රසය සම්බන්ධ වෙයි.

1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවට නියෝජිතයන් තෝරා පත්කර ගැනීමට පවත්වන මැතිවරණය වර්ජනය කිරීමට සිදුකරන ලද දේශපාලන මැදිහත් වීම ඔවුන් වෙත කිසියම් අපකීර්තියක් පසුකාලීනව රැගෙන ආවද ඒ මොහොතේ එම ස්ථාවරයේ පදනම වූයේ මේ ආකාරයේ සීමිත නියෝජනයක් නොව පූර්ණ නිදහස සහ ස්වයං පාලනයක් ලංකාවට අවශ්‍ය කරන්නේය යන්නයි. අවාසනාවකට මැතිවරණය වර්ජනය කිරීම කිසියම් ආකාරයක සාර්ථකත්වයක් අත්පත්කර ගත්තේ යාපනයේ පමණක් වන අතර එය රාජ්‍ය සභාව තුළ දෙමළ නියෝජනය කෙරෙහි බලපෑවේය. ජනවාර්ගික නියෝජනය කෙරෙහි උනන්දු නොවූ යාපන තරුණ කොන්ග්‍රසය අපේක්ෂා කරනු ලැබුවේ ස්වරාජ්‍යය දිනා ගැනීම විනා ඉන් මෙපිට කප්පාදු කරන ලද විසඳුම් නොවේ. නමුත් ඒ වෙනුවෙන් ඔවුන් සතු වූ දේශපාලන අනුරාගය සමස්ත රට තුළම ඒ ආකාරයෙන් පැතිරී ගොස් නොතිබීම නිසා මැතිවරණ වර්ජනය කිරීමේ ව්‍යාපාරය අවාසනාවන්ත ඉරණමකට මුහුණ දුණි.

ආර්ථික සහ කුල පීඩනයට එරෙහිව හඬ නඟමින් යටත්විජිත සමය තුළ පෙරින්බනායගම් සහ තරුණ කොන්ග්‍රසය විසින් ගොඩනඟන යටත්විජිත විරෝධී ජාතිකවාදය අනෙකුත් සිංහල දෙමළ ජාතිකවාදයන්ට ඇතුළත් කරගත නොහැකි වූ විශ්වීය අගයන්ගෙන් සමන්විත වූ ශ්‍රී ලාංකේය ජාතිකත්වයකින් පෝෂණය වී තිබිණ. 1927 කොන්ග්‍රස සැසියට පෙරින්බනායගම්ගේ ආරාධනයකට අනුව මහත්මා ගාන්ධි ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වන්නේ ඔවුන්ගේ දැක්ම තුළ ගාන්ධියානු මානවවාදයට සුවිශේෂී ස්ථානයක් හිමි වූ බැවිනි. 1928 දී ඔවුන් තීරණයකර තිබුණේ කොළඹ, නුවර, ගාල්ල සහ අනෙකුත් ප්‍රදේශයන්හි ශිෂ්‍ය කොන්ග්‍රස ගොඩනඟමින් පසුව සමස්ත ලංකා ශිෂ්‍ය කොන්ග්‍රසයක් ගොඩනැගීමටය. වැල්ලවත්ත ප්ලාසා තියටර් හි පැවැත්වුණු රැස්වීමට එකල ලංකාවේ නිවාඩුවක් ගත කිරීමට පැමිණ සිටි ජවහර්ලාල් නේරු පැමිණි බව වාර්තාවල සඳහන් වෙයි.

හැන්ඩි පෙරින්බනායගම් විසිවන සියවස තුළ මඟහැර යා නොහැකි චරිතයක් වන්නේ ඔහු සතු වූ විශ්වව්‍යාපී දැක්මත් දැඩි දේශපාලන කැපවීමත් නිසා වන අතර ඔහු සහ ඔහුගේ දැක්මෙන් හැඩගැසුණු යාපනය තරුණ කොන්ග්‍රසය යනු ලංකාවේ ඉතිහාසය වෙනස් කළ හැකිව තිබූ බලවේගයක් වන නිසාය.

## සේනක බිබිලේ (1920 - 1977)



වෛද්‍ය විද්‍යාව හුදු සමාජ ආභරණයක්ව පැවති යුගයක සිය දැනුම සහ හැකියාව පොදුජන යහපත වෙනුවෙන් යොදවන වෛද්‍ය සේනක බිබිලේ යනු විසිවන සියවසේ ප්‍රගතිශීලී සමාජ පරිකල්පනයේ ස්වභාවය පිළිබඳ සංකේතයක් වැනිය. විද්‍යාවේ සහ තාක්‍ෂණයේ දියුණුව විසින් අත්පත් කර ගත් ශක්‍යතා පොදු මිනිසා වෙත ලබා දෙන්නේ කෙසේද යන්න ඔහු ගැටුනු ප්‍රධාන ගැටලුවයි. වෛද්‍ය විද්‍යාව කෙතරම් දියුණු වී තිබුණද එහි ප්‍රතිඵල මිනිස් සමාජයක් ලෙස නෙළා ගැනීමට නම් ජයගත යුතු අභියෝග රාශියක් පැවතිණ. සුවිශාල දිළිඳු ජනගහනයක් සහිත දියුණු වෙමින් පවතින රාජ්‍යයක සෞඛ්‍යය ඉහළ දැමිය හැක්කේ රෝගීන් වෙත නිර්දේශ කරන ඖෂධ නියමිත පරිදි ඔවුන්ට ලබා ගැනීමට හැකි වැඩපිළිවෙළක් තිබේ නම් පමණකි. ඖෂධවේදය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ සේනක බිබිලේ සිය දැනුම මෙහෙය වූයේ මෙම අභියෝගය ජයගන්නා ජාතික ඖෂධ ප්‍රතිපත්තියක්

සකස් කිරීම වෙනුවෙනි. එහිදී ඔහු යුද ප්‍රකාශ කළේ මහා පරිමාණ ඖෂධ සමාගම්වලට එරෙහිවය. විවිධ වෙළඳ නාම ඔස්සේ පැමිණෙන ඖෂධ ඒවායේ මූලික ඖෂධීය නාමයෙන් රෝගීන්ට නිර්දේශ කිරීම මෙහි ආරම්භය විය. එසේම රෝගියෙකුට අවම ඖෂධ ප්‍රමාණයකින් සුව ලැබිය හැකි ආකාරයට බෙහෙත් නියම කිරීම මෙහි තවත් මානයක් විය. තාර්කික ආකාරයෙන් ඖෂධ භාවිත කිරීම ලෙස නම් කරන ලද මෙම ක්‍රියාවලිය ආරම්භ වූ පළමු වසරේදී පමණක් විදේශ විනිමය අතින් රටට මිලියන ගණනක ඉතිරියක් ලැබුණු බව වාර්තාවන්හි සඳහන් වෙයි. ඔහුගේ යෝජනාවට අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව පිහිටුවීමෙන් පසු ඔහු එහි පළමු සභාපතිවරයා වූ අතර ඔහු සේවය කළේ කිසිදු වේතනයක් හෝ වාහන ආදී අනෙකුත් පහසුකම් කිසිවක් නොගෙනය. රජය විසින් සාමාන්‍යයෙන් ආනයනය කරන 4000කට වඩා වැඩි ඖෂධ වර්ග 171 දක්වා අඩු කිරීමට හැකිවන ලෙස රට තුළ බෙහෙත් නිෂ්පාදනය වර්ධනය කිරීමට ඔහු ක්‍රියා කළේය.

මේ ක්‍රියාවලිය දැවැන්ත ඖෂධ සමාගම් විශාල අභියෝගයකට ලක්කරනු ලැබූ බව අමුතුවෙන් කිවයුතු නොවේ. මෙම සමාගම්වලට සහයෝගය දක්වන්නන් අතින් මේ ක්‍රියාවලිය ලංකාවේ වෙළඳපළ ආර්ථිකයට දරුණු බලපෑම් ඇති කරනු ඇති බවට අවධාරණය කෙරිණ. කෙසේ වුවත් අවසානයේ සමාගම්වල ප්‍රතිචාර සමඟ ඔහුගේ ක්‍රියාවලියට රජයෙන් ලැබුණු සහයෝගය හීන වී ගිය අතර ඔහු බලා සිටියදීම ඔහුගේ ප්‍රතිපත්ති ආපසු හැරවෙන්නට විය. මේ නිසා 1976 දී ඔහු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිත්වයෙන් ඉල්ලා අස්වන්නේ දැඩි කලකිරීමකින් යුතුවය. ඉන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධ ආයතනයක ඉල්ලීමකට අනුව දියුණු වෙමින් පවත්නා රටවල ඖෂධ ප්‍රතිපත්ති සකස්කිරීමේ ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකු ලෙස පත් වූ ඔහු මැලේසියාව, නේපාලය සහ ඇෆ්ගනිස්ථානය වැනි රටවල ඖෂධ ප්‍රතිපත්ති සකස් කළේය. ඕස්ට්‍රේලියාවේ ඖෂධ ප්‍රතිපත්තිය සකස් කිරීමේ පුරෝගාමියෙකු වූ වෛද්‍ය හාට් ප්‍රකාශ කරන්නේ 'මෙම විෂයේදී ලංකාව යනු කඳු මුදුනකි, එම කඳු මුදුනේ දැල්වෙන පහන සේනක බිබිලේය, අනෙකුත් රටවල් එම ආලෝකයෙන් තම ඖෂධ ප්‍රතිපත්ති සකස්කර ගෙන ඇත', යනුවෙනි.

## අයිෂා රාවුෆ් (1917 - 1992)



20 වන සියවස තුළ මෙරට මුස්ලිම් කාන්තා අධ්‍යාපනය වෙනුවෙන් වඩාත් පුරෝගාමී මෙහෙවරක් කළ තැනැත්තිය වන අයිෂා රාවුෆ් (1917-1992) මෙරට මුස්ලිම් කාන්තාවන්ගේ ජීවිත වෙනුවෙන් කළ බලපෑම සුවිශාලය. 20වන සියවසේ මුල් දශක තුළ පොදුවේ මෙරට මුස්ලිම් ප්‍රජාව අතර අධ්‍යාපනය කෙරෙහි අඩු උනන්දුවක් පැවැති සන්දර්භයක සුවිශේෂී ලෙස අධ්‍යාපනිකව ආන්තිකව සිටි මුස්ලිම් දැරියන් වෙත නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ ගෙන ඒම වෙනුවෙන් මුල සිටම ඇය මැදිහත්වූවාය.

මුස්ලිම් දැරියන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් නව පාසලක් ආරම්භ කිරීමට අවශ්‍ය හිඟ අරමුදල් සම්පාදනය කරගැනීමට කොළඹ නගරය පුරා කොඩි විකිණීමේ ව්‍යාපාරයක් දියත්කළ ඇය 1947 වන විට මෙරට ප්‍රගතිශීලී මුස්ලිම් නායකයින්ගේද සහාය ඇතිව මෙරට මුස්ලිම් කාන්තාවන් වෙනුවෙන් නොමිලේ අධ්‍යාපනය ලබාදෙන පළමු ඉංග්‍රීසි මාධ්‍ය පාසල ලෙස මුස්ලිම් කාන්තා විද්‍යාලය ආරම්භ කිරීමට සමත් වූවාය. එහි ආරම්භක විදුහල්පතිනිය ලෙස අයිෂා රාවුෆ් පත්වූ අතර එම යුගයේ පොදු ව්‍යවහාරය තුළ එම පාසල

හඳුන්වනු ලැබූයේ අයිෂා රාවුෆ්ගේ පාසල ලෙසිනි. තම දැරියන් පාසල් එවන ලෙස ඉල්ලා සිටිමින් ගෙයින් ගෙට යමින් දෙමාපියන් වෙත කරුණු පැහැදිලි කළ ඇය ආරම්භක අවස්ථාවේදී 20 දෙනෙකු වූ ශිෂ්‍යාවන් සංඛ්‍යාව මාස 2ක් ඇතුළත 200 දක්වා වර්ධනය කිරීමට සමත් වූවාය. ඊට පෙර බෙහෙවින් අඩු උනන්දුවක පැවැති මුස්ලිම් කාන්තා අධ්‍යාපනයේ (එවක පාසල් වෙත එවනු ලැබූ මුස්ලිම් ගැහැනු ළමුන්ගේ පාසල් ගමනද ඔවුන් වැඩිවියට පත්වූ පසු දෙමාපියන් විසින් නවතා දමනු ලැබිණි) අලුත් යුගයක් මේ පරිශ්‍රමයන් මගින් දිගහැරෙන්නට විය.

අධ්‍යාපන වරම් අහිමිව සිටි වයසින් වැඩි මුස්ලිම් කාන්තාවන් පවා ප්‍රාථමික පංති වෙත ඇතුළත් කරගනිමින්, ඔවුන් වෙනුවෙන් වඩා ලිහිල් අධ්‍යාපන වටපිටාවක් නිර්මාණය කළ ඇය සාම්ප්‍රදායික පාසලකට එහා යමින් විභාග ප්‍රතිඵල ඉලක්ක කොටගත් තරගකාරී අධ්‍යාපනයට වඩා අවවරප්‍රසාදිත පංති පසුබිම් තුළින් එන දැරියන්ටද වැඩියෙන් ඉඩ විවෘත වන නිර්මාණශීලී පිළිවෙතක් අනුගමනය කළාය. සියලු ජනවර්ගවලට අයත් පිරිස් සමඟ එක්ව වැඩකළ ඇය කාන්තාවන්ගේ ඉදිරිගාමීත්වයට එරෙහි ගතානුගතික ආකල්ප හා නොබියව සටන් කළාය. 1947 සිට 1962 දක්වා අපරාජිතව කොළඹ නගර සභා සභිකයකු ලෙස සක්‍රීය දේශපාලනයේ නිරත වූ ඇයට 1960 දී මුස්ලිම් කාන්තා විද්‍යාලය රජයට පවරා ගැනීමෙන් අනතුරුව සක්‍රීය දේශපාලනයද, නොඑසේනම් විදුහල්පති තනතුරද වන දෙකින් එකක් තෝරාගැනීමට සිදු වූ අවස්ථාවේදී ස්වේච්ඡාවෙන්ම නගර සභාවෙන් ඉල්ලා අස්වී මුස්ලිම් කාන්තා අධ්‍යාපනය වෙනුවෙන් කැපවීමට තීරණය කළාය. 1948දී කඳුකර දෙමළ ප්‍රජාවේ ඡන්ද බලය අහෝසි කර 1952දී ඔවුන් බැහැර කරමින් පැවැත්වූ මහමැතිවරණයේදී එම ජනයාට සිදුවූ අසාධාරණයට එරෙහිව දියත්කළ සත්‍යග්‍රහය සහ දින සියයේ උපවාසය දියත්කළ ලංකා ඉන්දීය කොන්ග්‍රසයේ ක්‍රියාමාර්ග සඳහා ඇය සිය සක්‍රීය දායකත්වය දැක්වූවාය. දේශපාලන ජීවිතය තුළ වාමාංශික නායකයින් හා සමීපව කටයුතු කළ ඇය කොළඹ නියෝජ්‍ය නගරාධිපතිනිය බවට පත්වන විට වාමාංශික පක්ෂවල සභයද හිමිවිය. ඇය සිය දේශපාලනයේ ප්‍රධාන අරමුණු ලෙස ප්‍රකාශ කර සිටියේ කාන්තාවන්ට සමාන වැටුප්, ළමා නිවාසවල තත්වය වැඩි දියුණු කිරීම, කොළඹ නගරයේ නිවාස හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය සහ මුස්ලිම් කාන්තාවන්ගේ දෑවැදි ක්‍රමය අහෝසි කිරීමය. ජනවාර්ගිකත්වය පදනම් කර නොගත් දේශපාලනයක නිරත වූ ඇය කොළඹ නගරයේ පැල්පත්වාසී අවවරප්‍රසාදිත ජනයා වෙත සමීප වූවාය.

සක්‍රීය දේශපාලයෙන් සමුගෙන නැවත සිය අධ්‍යාපන සේවය වෙත ගිය ඇය 1970 වන තුරු සිය මෙහෙවර ඉදිරියට ගෙනගියේ මෙරට මුස්ලිම් කාන්තා අධ්‍යාපනය තමන් පටන්ගත් තැනින් ගව් ගණනකින් ඉදිරියට ගෙන යමිනි. මෙරට මුස්ලිම් කාන්තාවන්ගේ ප්‍රගතිය සඳහා සුවිශේෂීවත් පොදුවේ මෙරට කාන්තා හා අවවරප්‍රසාදිත ජනයා වෙනුවෙනුත් වූ ඇයගේ කැපවීම අයිෂා රාවුෆ් 20 වන සියවසේ අපට මඟහැර යා නොහැකි චරිතයක් බවට පත්කොට ඇත.

## මාර්ටින් වික්‍රමසිංහ (1890 - 1976)



විසිවන සියවස ආරම්භයේ දී මාර්ටින් වික්‍රමසිංහ නවකතාකරුවෙකු ලෙස සිංහල සාහිත්‍යයට ප්‍රවේශ වන විට සිංහල නවකතාව පැවතියේ යටත්විජිත විරෝධී ජාතිකවාදය ජනයා වෙත ගෙන යන තීරණාත්මක වාහකයක් ලෙසය. එම යුගය තුළ ජනප්‍රියව සිටි ප්‍රධාන නවකතාකරුවා වූයේ පියදාස සිරිසේන වන අතර ඔහු අතින් ලියවුණු නවකතා අතීතකාමයත්, වික්ටෝරියානු සදාචාරයත් කුළුගන්වමින් නව සිංහල බෞද්ධ අනන්‍යතාවක් ගොඩනැංවීම වෙනුවෙන් කැප වී තිබිණ. වික්‍රමසිංහ මුලින්ම වැදගත් වන්නේ සිංහල නවකතාව මෙම තත්වයෙන් නව මානයකට ගෙනයාම හේතුවෙනි. ඔහු පවතින සමාජ යථාර්ථය නිරූපනය කළ හැකි සහ එය විශ්ලේෂණය කළ හැකි සාහිත්‍ය මාදිලියක් බවට සිංහල නවකතාව පත් කළේය. සිංහල නවකතාවේ නූතන සෞන්දර්යය ඔහු සොයා ගන්නේ පොදු ජන ව්‍යවහාරයන් තියුණු ලෙස නිරීක්ෂණය කිරීමෙනි. එහිදී ඔහු අතින් ඒ වන විට අධිපතිව පැවති ඇතැම්

සංස්කෘතික භාවිතයන් විවේචනයට ලක්විය. සමාජ මානවවිද්‍යාව පිළිබඳ ඔහු සතු සුවිශේෂී උනන්දුව ගැමි ජීවිතය සියුම් ලෙස සොයා බැලීමට ඔහු පොළඹවන ලද අතර අධිපති ප්‍රභූ ඉතිහාසයෙන් ගැලවී පොදුජන කේන්ද්‍රීය සාහිත්‍යයක් ගොඩනැඟීමට එය ඔහුට බලපෑවේය.

1890 වසරේ කොග්ගල උපත ලැබූ ඔහු නොවැළැක්විය හැකි ලෙසම එක් පැත්තකින් යටත්විජිත ධනවාදය වර්ධනය වන ආකාරයත් අනිත් අතින් දේශීය වැඩවසම් ප්‍රභූ පැලැන්තිය බිඳ වැටෙන ආකාරයත් අත්විඳි බව පැහැදිලිය. මේ වෙනස් ඓතිහාසික බලවේග දෙකක ගැටීම සහ නව දේශීය සමාජ පංතීන් බිහිවීම ඔස්සේ වෙනස්වන සමාජ සැකැස්ම වටහා ගන්නා කවුළුවක් බවට සිංහල සාහිත්‍යය පත්කිරීමේ පදනම දමන්නට ඔහුට හැකි වන්නේ මේ පරිවර්තනය විනිවිද දැකිය හැකි තියුණු දැක්මක් ඔහු සතු වූ නිසාය. ආර්ථික හේතු මත විධිමත් පාසල් අධ්‍යාපනයක් ලැබීමට අසමත් වන ඔහු මෙවැනි තියුණු දෘෂ්ටියක් ගොඩනගා ගන්නේ ස්වෝත්සාහයෙන් පොත පත කියවීමෙන් සහ පොදුජන සමාජය නිරීක්ෂණය කිරීමෙනි.

වර්ධනය වන සාක්ෂරතාවත් කියවීම ප්‍රධාන රසාස්වාදන සහ දැනුම ලබන ආකාරය වීමත් නිසා සාහිත්‍යකරුවන්ගේ කාර්යභාරය මේ යුගය තුළ අදට වඩා තීරණාත්මක වූවක් විය. අපට ආසන්නතම රට වන ඉන්දියාවේ රබින්ද්‍රනාත් තාගෝර් වැනි පෘථුල චින්තනයක් සහිත ලේඛකයින් විශ්වව්‍යාපී අදහස් මතු කරමින් ගෝරා වැනි නවකතා පළ කරන විට එම වසරේදීම ලංකාව තුළ ප්‍රකාශයට පත්වන්නේ සරල සිංහල බෞද්ධ ජාතිකවාදයක් හා අතීතකාමයක් කුළු ගැන්වූ ජයතිස්ස සහ රොස්ලින් වැනි නවකතාය. සිංහල නවකතාව නූතන රාමුවක් තුළට ගෙන යාමට අවශ්‍ය කරන විශ්වව්‍යාපී චින්තනයක් සතු සාහිත්‍යකරුවා වූයේ වික්‍රමසිංහයි. බටහිර ප්‍රබුද්ධත්වයේ අගයන් බැහැර නොකරමින් ඒවා ලාංකේය පොදුජන සමාජය තුළ ප්‍රකාශමාන විය හැකි සුවිශේෂී ආකෘති ගැන උනන්දු වෙන ඔහුගේ සාහිත්‍ය භාවිතය නූතන සිංහල සාහිත්‍යය බිහිවීමට පදනම දැමුවා වුවද අධිපති සාහිත්‍ය කතිකාව තුළ ඔහු පිළිබඳ ඇති වැටහීම සීමිත ඌනිතවාදී එකකි. වරක් බුද්ධ චරිතය පදනම් කර ගෙන ඔහු ලියූ බව තරණය නවකතාව කෙරෙහි කෝපයට පත් වූ බෞද්ධ ජාතිකවාදීන් ඔහු සිරගත කළ යුතු බවත් කෘතිය තහනම් කළ යුතු බවත් අවධාරණය කළ බවද අමතක කළ නොහැකිය. විසිවන සියවස තුළ වික්‍රමසිංහගේ භූමිකාව වර්තමාන සිංහල සාහිත්‍යයේ හැඩගැස්මට කළ බලපෑම අති විශාලය. එසේම ඔහුගේ නවකතා සහ ඔහු

විසින් රචනා කරන ලද අනෙකුත් ලේඛන තුළ කැටි වූ ඔහුගේ පෘථුල චින්තනය මේ යුගය තුළ නූතන ශ්‍රී ලංකාවක් පිළිබඳ පරිකල්පනය කළ මිනිසුන්ට තියුණු ආලෝක ධාරාවක් සැපයීය.

# සිවා චින්නතම්බි (1921 - 2000)



20වන සියවස තුළ මෙරට කාන්තාවන්ගේ සෞඛ්‍යය වෙනුවෙන් සුවිශේෂී මෙහෙයක් ඉටු කළ වෛද්‍ය සිවා චින්නතම්බි එම යුගයේ වඩාත් ජාත්‍යන්තර ඇගයීමට ලක්වූ ලාංකේය වෛද්‍යවරියකි. මෙරට බිහිවූ මුල්ම ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරියන් අතර ප්‍රධානතම චරිතය වූ ඇය ආසියාවට කාන්තා උපත් පාලනය හඳුන්වාදීමේ පුරෝගාමී තැනැත්තියද වේ. මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙත වන ඇයගේ මැදිහත්වීම නිර්මාණය වන්නේ නිදහස් සෞඛ්‍යයේ වර්ධනය සමඟ වැඩිවන ආයු අපේක්ෂාව සමඟ එම ජනගහනයට සුදුසු ජීවන තත්වයක් උදාකරදීමේ අභියෝගය සම්බන්ධයෙන් වූ තියුණු දැක්මකිනි. යටත්විජිත පාලනයෙන් නිදහස ලබා දියුණු ජාතියක් ලෙස නැගී සිටීමට පරිකල්පනය කරද්දී ජනගහන වර්ධනය විසින් භූමියේ සීමිත සම්පත් කෙරෙහි ඇති කරන බලපෑම එම රටවල් මුහුණුදුන් ප්‍රධානතම

අභියෝගයයි. බොහොමයක් අලුතින් නිදහස ලැබූ රටවල් එදා සිය අධික ජනගහන වර්ධන වේගයත් සමඟ කුසගින්න, දරිද්‍රතාව හා පහළ ජීවන මට්ටමක ගිලීයද්දී නිදහස ලැබූ මුල් යුගය තුළ ශ්‍රී ලංකාව වඩා නූතන සංවර්ධනයන් දෙසට හැරුණු රටක් බවට පත්වූයේ සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල විශිෂ්ඨ ගුණාත්මකභාවයක් අත්පත් කරගැනීමට සමත් වූ බැවිනි. එහිදී උපත් සීමා කිරීම තුළ ජනගහන පාලනය රටේ ජනතාවට උසස් ජීවන මට්ටමක් උදාකරදීමේ මූලික කොන්දේසියක් බව වටහාගත් වෛද්‍ය සිවා චින්නතම්බි 1961දී ආසියාවේ පළමුවරට කාන්තා උපත් පාලන පෙති අත්හදා බැලීම් ආරම්භ කළාය. අදද උපත් පාලනය සම්බන්ධයෙන් ඉතා සිල්ලර ලෙස අසන්නට ලැබෙන 'ජාතිය වඳ කිරීම' පිළිබඳ ජාතිවාදී මුග්ධ විවේචන හමුවේ සිය කර්තව්‍ය ඉදිරියට ගෙන යෑමට ඇය සමත් වූවාය. දරුවන් 10-12 ලබමින් එහිම ප්‍රතිඵලයක් ලෙස මන්දපෝෂණයට හා විවිධ සෞඛ්‍ය අන්තරායන්ට මුහුණදුන් කාන්තාවන්ට එය විශාල අස්වැසිල්ලක් විය. එම පරිශ්‍රමයන්හි ප්‍රතිඵලයක් ලෙස පවුල් සැලසුම මෙරට මාතෘ සෞඛ්‍යය සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තියේ අංගයක් බවට පත්වූ අතර එය අදටද ප්‍රජා සෞඛ්‍ය ක්‍රමවේදය තුළ ප්‍රමුඛ වැදගත්කමක් උසුලයි. එකී මෙහෙවර නිරූපනය වූ එක් දර්ශකයක් වූයේ මෙරට පහළ ගිය මාතෘ මරණ අනුපාතයයි. සිය ජීවිත කාලය පුරා අවවරප්‍රසාදිත කාන්තාවන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් කැපවූ ඇය කොළඹ නගරය තුළ පිහිටි සිය නිවස කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යාවන් සඳහා නේවාසිකාගාරයක් ස්ථාපිත කරනු පිණිසද, යාපනයේ පිහිටි සිය පවුලේ පාරම්පරික නිවස මාතෘ රෝහලක් ස්ථාපිත කරනු පිණිසද පරිත්‍යාග කළාය.

## නඩේස අයියර් (1887 - 1947)



මීට වසර 200 කට පෙර යටත්විජිතවාදීන් විසින් අරඹනු ලැබූ ඉන්දීය කම්කරුවන් වතු කර්මාන්තය වෙනුවෙන් මෙරටට රැගෙනවිත් සේවයේ යෙදවීමේ ක්‍රියාවලිය තුළ ඔවුහු අතිශය සූරාකෑමට ලක්වූහ. නිදහසින් පසුවද මෙරට ආර්ථිකයේ බරපතළ ව්‍යුහාත්මක වෙනසක් නොකර ඒ අයුරින්ම පවත්වාගත් දේශීය පාලක ප්‍රභූන්ටද මේ ජනයා ගෙවන දුක්ඛිත ජීවන තත්වයේ බරපතළ වෙනසක් සිදුකිරීමේ වුවමනාවක් නොවීය. පළමුවරට කඳුරට දෙමළ ජනයාගේ අයිතීන් වෙනුවෙන් සිදුකළ බරපතළම මැදිහත්වීම කරනු ලැබූයේ නඩේස අයියර් විසිනි.

1921 දී මෙරට පළමු දෙමළ දිනපතා පුවත්පත වූ 'දේශනේසාන්' ආරම්භ කළ නඩේස අයියර් මෙරට කඳුකර දෙමළ ප්‍රජාවගේ ගැටලු පිළිබඳ ජාතික තලයේ මුද්‍රණ මාධ්‍යයෙන් සාකච්ඡා කිරීමට පටන් ගත්තේය. එකල බ්‍රිතාන්‍ය පාලකයින් පිටස්තර කිසිවෙකුට ඇතුල්වීම පවා තහනම්කර තිබූ වහල් කලාප ලෙස පවත්වාගෙන යනු ලැබූ වතු තුළට වෙස්වළාගෙන ඇතුල් වෙමින් කම්කරුවන්

හා සබඳතා ගොඩනගා ගනිමින් ඔහුගේ ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාවලිය ඇරඹිණි. වතු කම්කරුවන් වෙනුවෙන් 'දේසභක්තන්' නමින් පුවත්පතක් ඔහු විසින් ආරම්භ කළ අතර එය රහසේ සුදු වතු අධිරාජ්‍යය පුරා බෙදාහැරීමට කටයුතු කළේ ජනතාව තුළ සිය අයිතීන් පිළිබඳ නව ප්‍රබෝධයක් ඇති කරවමිනි. සිය ක්‍රියාකාරකම් වතුකරයට පමණක් සීමා නොකළ ඔහු පොදුවේ ලාංකේය කම්කරු පංතිය සංවිධානය කිරීම වෙනුවෙන් පෙනී සිටියේය. 1927දී ලංකා කම්කරු සංගමය විසින් මෙහෙයවන ලද වරාය වැඩවර්ජනයට ඉන්දියාවෙන් ගෙන්වන ලද කම්කරුවන් එක්කර ගැනීමට නඩේස අයියර් සමත්විය. මෙරට සමහර කම්කරු නායකයින් පවා ඉන්දියානු කම්කරුවන් මෙරට කම්කරුවන්ගේ රැකියා අවස්ථා අඩු වැටුපට සේවය කරමින් උදුරා ගන්නා පිරිසක් ලෙස දකිද්දී නඩේස අයියර්ගේ දැක්ම වූයේ මේ බිමේ වසන සියල්ලන්ගේම අනාගතය රැඳී ඇත්තේ රටේ සංවර්ධනය මත බවයි. එබැවින් සියල්ලන් එක්ව නොබෙදී ඒ වෙනුවෙන් සටන් කළ යුතු බව ඔහුගේ අදහස විය.

විශිෂ්ට කථිකයකු වූ හෙතෙම සිය අදහස් වෙනුවෙන් විශාල ජනතා ආකර්ෂණයක් දිනා ගැනීමට සමත් වූ අතර වතු කම්කරුවන්ගේ ප්‍රථම වෘත්තීය සමිතිය වූ සමස්ත ලංකා වතු කම්කරු සම්මේලනය ආරම්භ කළේය. 1936 දී හැටන් ආසනය නියෝජනය කරමින් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්වූ ඔහු ලෝක වෙළඳපොළේ තේ මිල අනුව කම්කරුවන්ගේ වැටුප් තීරණය කිරීමේ සියලු උත්සාහයන් පරාජය කිරීමට මූලික විය. 1930 දශකය අග භාගයේදී බදුල්ල වේවැස්ස වත්තේ කම්කරුවන් විසින් වත්තේ බලය අල්ලා ගැනීමත් සමඟ ඇතිවූ තත්වය තුළ මෙරට වතු ක්ෂේත්‍රයේ පළමු සාමූහික ගිවිසුම අත්සන් කිරීමේදී සුවිශේෂී භූමිකාවක් නඩේස අයියර් විසින් ඉටු කරනු ලැබිණි. 1930දී කඳුකරයේ ප්‍රථම මුද්‍රණාලය වූ 'සහෝදරී' ඔහු විසින් ආරම්භ කළ අතර ඒ මගින් පළ කරනු ලැබූ පුවත්පත් වතු කම්කරුවන්ගේ දෛනික ජීවිතයේ තීරණාත්මක වෙනසක් සනිටුහන් කරන ලදී. නඩේස අයියර් කඳුකරයේ දෙමළ සාහිත්‍යයේ පියා ලෙස ගෞරවයට පත්වේ.

## කුමාරි ජයවර්ධන (1931)



ආචාර්ය කුමාරි ජයවර්ධන ශ්‍රී ලංකාවේ සිටින ප්‍රමුඛතම වාමාංශික ස්ත්‍රීවාදී විද්වතෙකි. තුන්වන ලෝකයේ ස්ත්‍රීවාදය සහ ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යාපාර න්‍යායගත කිරීමෙහිලා ඇයගේ ශාස්ත්‍රීය අධ්‍යයනයන් විශාල දායකත්වයක් සපයා ඇත. 1970 දශකය අගදී ආරම්භ කළ සමාජ විද්‍යාඥයන්ගේ සංගමයේ ආරම්භක සාමාජිකාවක වූ ඇය ශ්‍රී ලාංකේය වාමාංශික ව්‍යාපාරයේ සහ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ ප්‍රමුඛ භූමිකාවක් ඉටු කළාය.

කුමාරි ජයවර්ධන, ප්‍රභූ පංතිය තුළ කේන්ද්‍ර වූ සමාජ පර්යේෂණ නිර්ප්‍රභූ ලෝකයට ගෙන ආ ප්‍රධානතම ශ්‍රී ලාංකේය පර්යේෂකයා ලෙසට ගෞරවය හිමිකර ගනී. කුමාරි ජයවර්ධනගේ 'ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම (1978), 'සොක්කන් ලොක්කන් වූ වගයි': ශ්‍රී ලංකාවේ යටත්විජිත

ධනේශ්වරයේ නැඟීම (2006) සහ Ethnic and Class Conflict in Sri Lanka (The Emergence of Sinhala-Buddhist Consciousness 1883-1983 (2003) යන කෘතීන් ශ්‍රී ලංකාවේ ඉතිහාසය, පංති දේශපාලනය, සහ දේශපාලන ව්‍යාපාර පිළිබඳ දැනුමට ඓතිහාසික දායකත්වයක් දක්වා ඇත. ප්‍රභූ සමාජයේ සහ වැඩවසම් රාජ්‍යයේ සැබෑ ස්වරූපය, එහි ව්‍යාජය සහ එමඟින් සිදුකරන වැඩකරන පංතියේ සූරාකෑම තියුණු විශ්ලේෂණාත්මක මනසින් විනිවිද දකිමින් සමාජය වෙත හෙළිදරව් කරන කුමාරි වඩා සාධාරණ සමාජයක් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අනවරත ශාස්ත්‍රීය සහ පර්යේෂණාත්මක ගමනක නිරත වී අද වන විට අනූතුන් වියේ පසු වේ.

1986 දී ආචාර්ය කුමාරි ජයවර්ධන ප්‍රකාශයට පත්කළ 'තුන්වන ලෝකයේ ස්ත්‍රීවාදය සහ ජාතිකත්වය' යන කෘතිය බටහිර නොවන ස්ත්‍රී ව්‍යාපාර පිළිබඳ අතිවිශිෂ්ට අධ්‍යයනයක් ලෙස සලකනු ලබයි. එය චීනය, ඊජිප්තුව, ඉරානය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, කොරියාව, පිලිපීනය, ශ්‍රී ලංකාව, තුර්කිය සහ මියන්මාරය යන රටවල ස්ත්‍රී ව්‍යාපාර සඳහා මඟ පෙන්වන කෘතියකි. ලෝකයේ "අපගේ කලාපය" පිළිබඳ දැනුම සම්බන්ධයෙන් ඇති හිඩැස ආමන්ත්‍රණය කිරීමට ඇයට අවශ්‍ය විය. 1986 වර්ෂයේදී මෙම ග්‍රන්ථය එංගලන්තයේ Feminist Fortnight සම්මානය සඳහා තේරී පත්විය. වර්තමානයේදී මෙම කෘතිය ස්ත්‍රීවාදී ව්‍යාපාර සම්බන්ධ ලොව ප්‍රමුඛතම අධ්‍යනයක් ලෙස සැලකෙන අතර ලෝකය පුරා ස්ත්‍රීන් පිළිබඳ අධ්‍යයන පාඨමාලා තුළ බහුලව යොදා ගැනේ.

එතෙක් බටහිර කාචයෙන් නිරීක්ෂණය කෙරුණු තුන්වන ලෝකයේ ස්ත්‍රී ව්‍යාපාරය කලාපීය සහ ස්වදේශීය කෝණයකින් විශ්ලේෂණය කරන කුමාරි ජයවර්ධන, අපගේ කලාපයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ව්‍යාපාරයේ අනාගත දැක්ම සහ දිශානතිය තෝරාගැනීමට ඉතාමත් වැදගත් වන පසුබිම් අධ්‍යයනයක් සපයයි. "තුන්වන ලෝකයේ විමුක්තිය සහ සමාජ පරිවර්තනය උදෙසා වූ ඕනෑම ව්‍යාපාරයක් ශක්තිමත් කළ හැක්කේ සූරාකෑමෙන්, මර්දනයෙන්, සහ පුරුෂාධිපති ව්‍යුහයන්ගෙන් තමන්වම නිදහස් කරගැනීම වෙනුවෙන් අරගල කරන ගැහැනුන්ගේ සහභාගිත්වයෙන් පමණකි" ලෙස කුමාරි 1986දී ලියා තබන්නේ අද අප ලංකාවේ දකින ස්ත්‍රී දේශපාලන පිබිදීම අතිවිශිෂ්ට ලෙස පුරෝකථනය කරමිනි. කුමාරිගේ අඛණ්ඩ තේමාවක් සහ සමාජ පණිවිඩයක් වූ ගැහැනු දේශපාලනයේ තීරණාත්මක බව අද වන විට අප ඉදිරියේ ප්‍රකාශමාන වී ඇත.

පංති හෝ කුල ලෙස, වාර්ගිකත්වය හෝ ආගම ලෙස, ස්ත්‍රී පුරුෂ ලෙස බෙදුණු සමාජයක් වෙනුවට සමානාත්මතාවයෙන් යුතු සමාජයක්, පංති සූරාකෑමෙන් තොර වූ සමාජයක්, ස්ත්‍රී පරිපීඩනයෙන් තොර වූ සමාජයක් පරිකල්පනය කළ ආචාර්ය කුමාරි ජයවර්ධන සැබෑ ශ්‍රී ලාංකේය රාජ්‍යයක් කරා වැටී ඇති ගමන් මඟ සොයාගැනීම උදෙසා අතිශය ප්‍රශංසනීය මැදිහත්වීමක් සිදු කළාය. බලය යන්න, මිට මොළවාගත් අතක් ලෙස පමණක් නොව අත්ල පිටතට පෙනෙන සේ ඔසවා ඇති ආශිර්වාදාත්මක හස්ත මුද්‍රාවක සංකේතීය ස්වරූපයද ගත හැකි බව පවසන කුමාරි ජයවර්ධන ශ්‍රී ලංකාවේ සියලු පීඩිත ජනයාගේ විමුක්තිය වෙනුවෙන් අවැසි දැනුම් බලය ජනනය කිරීමට අද්විතීය කාර්යභාරයක් ඉටු කළාය.

# මිනෙට් ද සිල්වා (1918 -1998)



ගෘහනිර්මාණ ශිල්පිනියක ලෙස පුහුණුව ලැබූ පළමු ශ්‍රී ලාංකික ස්ත්‍රිය මිනෙට් ද සිල්වාය. 1948 දී බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ශිල්පින්ගේ රාජකීය ආයතනයේ (RIBA) සාමාජිකාවක් බවට පත් වූ ඇය එසේ පත් වූ පළමු ආසියානු ස්ත්‍රිය වූවාය. සිය වෘත්තීමය නිපුණතාව සහ දායකත්වය වෙනුවෙන් අන්තර්ජාතික ගෞරවය ලැබූ මිනෙට්හට පිකාසෝ සහ ලෙ කොබුසියේර් වැනි විසිවන සියවසේ දැවැන්තයින් සමඟින් වැඩ කිරීමට අවස්ථාව උදා විය.

ගෘහනිර්මාණ ශිල්පයේ ප්‍රවේශයක් වන 'නූතන ප්‍රාදේශිකවාදය' (Modern Regionalism - පසුව Critical Regionalism නමින් හැඳින්වේ) ගොඩනැඟීම වෙනුවෙන් මිනෙට් අන්තර්ජාතික පිළිගැනීමට ලක්වූවාය. එකල පැවති ප්‍රභූ පංතියේ රුචිකත්වයට ගැලපුණු ගෘහනිර්මාණ ශිල්පයෙන් බැහැර වූ මිනෙට් පොදු ජන සම්ප්‍රදාය නිර්මාණශීලී ලෙස භාවිතා කරමින් ශ්‍රී ලාංකේය ගෘහ

නිර්මාණ ක්ෂේත්‍රයේ ජනතාවාදී මුද්‍රාව තැබුවාය. 'අක්කර ගණන් පැතිරුණු ගෙවතු සහ කුළුණුවලින් සමන්විත සිසිල්, විශාල ශාලාවන් තවදුරටත් නොමැති කොළඹ වැනි ජනාකීර්ණ නගරවල සුවපහසුවට ජීවත් වීම ගැන අපට ඇති අදහස් අප නැවත සකස් කරගත යුතුය' ලෙස ඇය 1955 වසරේදී කියා සිටියේ ඇයගේ චින්තනයේ නූතනත්වය සහ සාමාන්‍ය ජන සමාජය කාලීන අභියෝගයන්ට මුහුණ දීමට අනුගත වීමේ වැදගත්කම කියා පාමිනි. මහනුවර, වටපුළුව පොදු නිවාස සංකීර්ණය නිර්මාණය කිරීමේදී ඇය භාවිතා කළ ක්‍රමවේද අදටද ක්ෂේත්‍රයේ පැසසුමට ලක් වේ.

මිනෙට් 1949 වසරේ ශ්‍රී ලංකාවේ ගෘහනිර්මාණ සේවා මැදිරියක් අරඹන විට, තම නමින්ම ගෘහනිර්මාණ වෘත්තියේ යෙදුණු ලෝකයෙහිම දෙවැනි ස්ත්‍රිය ඇය විය. පිරිමි හවුල්කරුවකු නැතිව, ස්ථාපිත සමාගමකින් බැහැරව, ස්වාධීනව, ශ්‍රී ලංකාවේ පළමු සහ එකම ස්ත්‍රී ගෘහනිර්මාණ ශිල්පිනියක ලෙස 1951දී ඇය විසින් කරන ලද පළමු ගොඩනැගිල්ලට මහත් අවධානයක් යොමු විය. ස්ත්‍රියක නිසාවෙන්ම ගනුදෙනුකරුවන් මෙන්ම ඇයගේම කොන්ත්‍රාත්කරුවන්ද ඇයගේ අදහස් බොහෝ විට ප්‍රශ්න කරන්නට විය. ඇතැම් අවස්ථාවලදී ඇය විසින් නිර්මාණය කරන ලද සැලසුම් ඉදිකිරීමට කොන්ත්‍රාත්කරුවන් එකඟ කරගැනීම සඳහා ඒවා එංගලන්තයේ ඉංජිනේරුවෙකු ලවා අනුමත කර ගැනීමටද ඇයට බල කෙරුණි. වැඩවසම් මෙන්ම ධනවාදී ස්ථාපිතයේ ප්‍රධානතම ලක්ෂණයක් වන පුරුෂෝත්තමවාදයට අභියෝග කළ මිනෙට්, ස්ත්‍රී දෙවන පුරවැසිභාවය වෙනුවට අනාගත ස්ත්‍රී සම-පුරවැසි භූමිකාවක පෙර මං සලකුණක් වූවාය.

මිනෙට්ගේ චින්තනය මෙන්ම ප්‍රාදේශිකවාදය සහ නූතන සෞන්දර්ය ශාස්ත්‍රය පිළිබඳ ඇයගේ අදහස් තිබුණේ ඇය ජීවත් වූ යුගයට වඩා ඉතා ඉදිරියෙනි. එලෙසම ඇය විසින් ප්‍රගුණ කළ පාරිසරික ගෘහනිර්මාණ ශිල්පය (eco-architecture) සහ සහභාගීත්ව සැලසුම්කරණය'participatory design'වැනි ප්‍රවේශයන් එකල නිශ්චිත ලෙස සංකල්පගත වී හෝ තිබුණේ නැත. ඇය විසින් 1958දී නිර්මාණය කරන ලද වටපුළුව නිවාස සංකීර්ණය දෙස බලන විට මෙම සංකල්ප භෞතිකකරණය වී ඇති ආකාරය දැකිය හැකිය. ඇය විසින් නිර්මාණය කරන අවකාශ විවිධත්වයන් එකට එක් කරන සහ සාමූහිකත්වය තීව්‍රකරන ඒවා වූ අතර ඒවා ඇගේ විශ්වව්‍යාපී දැක්මේ පිළිබිඹු ලෙස දැකිය හැකිය.

සම්ප්‍රදායෙන් සම්පූර්ණයෙන්ම බැහැරව අලුත්ම ශෛලියක් ආනයනය කිරීම වෙනුවට, අභාවයට යන දේශීය ශිල්ප කලාවන්ට නැවත ජීවය දෙන අතරම ශ්‍රී ලාංකේය ගෘහනිර්මාණ ශිල්පයේ සාම්ප්‍රදායික අංගයන් නවීකරණය කිරීම යන දෙකම කිරීමට කටයුතු කළ මිනෙට් අතීත සම්ප්‍රදායන් සමඟ මුසු වූ නූතන ශ්‍රී ලාංකේය ගෘහ නිර්මාණ ශෛලියක් පරිකල්පනය කළාය. අතීත ශ්‍රී විභූතිය පිළිබඳ කතිකාවක සිර වූ ලාංකේය තාක්ෂණික විශිෂ්ටත්වය විසිවන සියවසට ඇද දමන ඇය ස්ත්‍රී ඒකාකෘතිය බිඳ දමමින් සාම්ප්‍රදායික ලෙස පිරිමි තාක්ෂණික ක්ෂේත්‍රයක අසමසම දස්කම් දැක්වූවාය.

මිනෙට්ගේ මැදිහත්වීමේ තීරණාත්මක බව සහ අනාගතවාදී බව ඇයගේ ශිල්පීය කෞශල්‍යයෙන් ඔබ්බට යන්නේ ඇය එකල (සහ බොහෝ දුරට තවමත්) දේශීයව මෙන්ම අන්තර්ජාතිකව, සාම්ප්‍රදායික ලෙස පිරිමි ආධිපත්‍යයක් තිබෙන ක්ෂේත්‍රයක අනභිභවනීය සලකුණක් තබමින් ශ්‍රී ලංකාවේ අනාගත ස්ත්‍රී පරපුරට එම ක්ෂේත්‍රයේ දොරගුළු විවෘත කළ දුන් නිසාවෙනි. එහෙත් අවාසනාවන්ත ලෙස, එම ක්ෂේත්‍රයේ දක්ෂතා පෙන්වූ පුරුෂයින් හා සාපේක්ෂව මිනෙට්ගේ භූමිකාව ලාංකේය සමාජයේ සැමරීමට ලක් වන්නේ හෝ ඇයගේ වෘත්තිමය දායකත්වය වටා කතිකාවක් ගොඩනැගෙන්නේ ඇය අභාවයටද පත් වී වසර ගණනාවකට පසුවය.

උදාහරණ ලෙස විස්තරාත්මකව සඳහන් කරන ලද ඉහත චරිත දහයට අමතරව විසිවන සියවස තුළ ජීවත් වූ ඉහත සඳහන් කළ නූතනත්වයේ මූලධර්ම අඩුවැඩි වශයෙන් ප්‍රකට කළ සිංහල, දෙමළ, මුස්ලිම් සහ ගැහැනු, පිරිමි තවත් සුවිශේෂී චරිත ගණනාවක් අපට මුණගැසෙන අතර ඔවුන්ගේ චින්තනය හා ක්‍රියාකාරකම් අද අප ජීවත් වන ලංකාවේ සමාජ දේශපාලනික සංස්කෘතික පොළොවේ ඇති සාධනීය ලක්ෂණ ගොඩනැගීමට දායක වී ඇත. මේ ඇතැමුන් පිළිබඳව යම් යම් විවේචන යම් යම් මානයන්ගෙන් ඇති වී තිබුණද පොදුවේ ඔවුන් විසින් ශ්‍රී ලාංකේය අර්ථයෙන් නූතනත්වය ඇති කිරීම වෙනුවෙන් කරන ලද මෙහෙය සැමරීමේ හා හිතාමතා යටපත් කරන ලද විසිවන සියවස නැවත ඉස්මතුකර සටහන් කිරීමේ කාර්යය තවදුරටත් සිදුවිය යුතු බව අපේ හැඟීමයි.

# ජාතික ජනබලවේගය: විසි එක්වන සියවසේ බලාපොරොත්තුවේ කවුළුව හෙවත් ජාතික පුනරුදය

2022 දී ඇති වූ ආර්ථික කඩාවැටීම විසින් අවුරුදු 76ක් පුරා ක්‍රියාත්මක වූ අන්ත දූෂිත ප්‍රභූ පාලක පංති දේශපාලන සංස්කෘතිය අවසන් කිරීමේ කදිම අවස්ථාවක් උදකර දී ඇත. රට සුඛිත මුදිත රාජ්‍යයක් කරන බවට දිගින් දිගටම මාරුවෙන් මාරුවට දූෂිත ප්‍රභූ පංතිය දුන් මැතිවරණ පොරොන්දුවල බොරුව රට ණය කන්දරාවක හිර කරමින් හා බංකොලොත්භාවයට පත් වීමෙන් හෙළිදරව් විය. ආර්ථික කඩා වැටීමත් සමඟ පැන නැගි ජනතා අරගලය ජනාධිපතිවරයා, අගමැතිවරයා හා කැබිනට් මණ්ඩල 3ක් පළවා හැරීමෙන් අවසන් වූ අතර රටේ ජනයාට ජනතා බලය පිළිබඳ අදහසක් හා නව විශ්වාසයක් ඇතිකරන ලදි. අරගලයේ කේන්ද්‍රීය සටන් පාඨය වූ 74 වසරක සාපය අවසන් කරමු යන්න නිදහසින් පසු බලය හෙබවූ කොළ හා නිල් පාට කල්ලි දෙකම එකම හොර කණ්ඩායමක්ය යන අදහස සමාජගත වූ ගැඹුර ගැන හොඳම සාක්ෂියකි. අවුරුදු 76කට පසුව ලංකාව වෙනුවෙන් රට කරවූ දූෂිත ප්‍රභූ පාලක දේශපාලන සංස්කෘතිය අවසන් කිරීමේ තීන්දුවකට පැමිණ ඇති බවට සියලු සලකුණු පහළ වී ඇත. වයස්, ලිංග, පක්ෂ, නාගරික, ග්‍රාමීය, පංති භේදයකින් තොරව අති විශාල ජන ආකර්ෂණයක් ජාතික ජනබලවේගය වෙත ඇදෙමින් තිබේ. මෙතෙක් පැවැත්වූ සියලු සමීක්ෂණද රට පුරා පැවැත්වෙන ජාතික ජනබලවේගයේ ජන රැලිවලට ඇදෙන ජනයාද විවිධ වෘත්තිකයින්

සංවිධානාත්මකව සම්බන්ධවීම්ද විදෙස් ගත ශ්‍රී ලාංකිකයින්ගේ ආකර්ෂණයද අන්තර් ජාතික ප්‍රජාවෙන් ලැබෙමින් තිබෙන අවධානයද මේ වන විට තනි කණ්ඩායමක් බවට පත්ව ඇති දූෂිත ප්‍රභූ කල්ලිය තුළ ඇතිව තිබෙන දැඩි කැළඹීමද කියා පාන්නේ ජාතික ජනබලවේගය වෙත ලැබෙමින් පවතින ජන ආකර්ෂණයේ මට්ටමයි. මෙලෙස 2024දී ජාතික ජනබලවේගය බලයට පත් වීමේ ඉඩකඩක් සමගම ඉතිහාසයේ විවෘත වන ස්වර්ණමය අවස්ථාව නිදහස ලබද්දී අපට අහිමි වූ හා අවුරුදු 76ක කාලයක් ඉටු කර ගත නොහැකි වූ නූතන ඉදිරිගාමී ශ්‍රී ලාංකේය රාජ්‍යයක් ඇතිකර ගැනීමේ අති දුර්ලබ අවස්ථාවයි. විසිවන සියවසේ වීරයින් හා වීරවරියන් දුටු සිහිනය මහ පොළොව මත සැබෑ වීමේ අවස්ථාවයි.

අදූෂිත දේශපාලන සංස්කෘතියක් ඇතිකිරීමේ ජාතික ජන බලවේගයේ සහතිකය පිළිබඳව පුළුල් මහජන විශ්වාසයක් ගොඩනැගී ඇත. ලාංකේය දූෂිත ප්‍රභූ පාලක පංතිය විසින් දිගින් දිගටම මගහරිනු ලැබූ ලංකාව නිෂ්පාදන ආර්ථිකයක් බවට පත්කිරීමේ වගකීම ජාතික ජනබලවේගය විසින් භාරගෙන ඇත. ණය ගැනීමත් ජාතික සම්පත් විකුණා දැමීමත් අධික බදු බර ජනතාව වෙත පැටවීමත් යන වත්මන් ආණ්ඩුවේ තෙවැදෑරුම් ප්‍රවේශය වෙනුවට නිෂ්පාදන ආර්ථිකයක් මගින් ආර්ථික අගාධයෙන් ගොඩයෑමේ මාවත ජාතික ජනබලවේගයේ ප්‍රවේශයයි. ඉංජිනේරු ඩී.ජේ. විමලසුරේන්ද්‍ර 1920 හා 1930 ගණන්වල ඉදිරිපත් කළ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීමේ යෝජනාව විසිඑක්වන සියවසට ගැලපෙන ලෙස ක්‍රියාවට නැංවීම ජාතික ජනබලවේගයේ අපේක්ෂාවයි. ඒ, අවුරුදු සියයක නොසලකා හැරීමෙන් පසුවය. තාක්ෂණික වශයෙන් දියුණු ලංකාවක් ඇතිකිරීමේ ධාවනයේ මුල් වටය සම්පූර්ණ කරමින් විමලසුරේන්ද්‍ර විසින් ලබාදෙන යෂ්ටිය බාර ගැනීමට ඊට සියවසකට පසුව ජාතික ජනබලවේගය ඉදිරිපත්ව සිටියි. ලාංකේය ආර්ථිකය ස්ථාවරයකට ගෙන ඒමේ කාර්යයට අමතරව නිෂ්පාදන ආර්ථිකය පිළිබඳ වැඩපිළිවෙළ නිදහසින් පසු තවමත් කිරීමට අපොහොසත් වූ තවත් ජාතික අභිලාෂයක් ඉටු කර ගැනීමට අවශ්‍ය පදනම සපයයි. ඒ, නිෂ්පාදන ආර්ථික වැඩපිළිවෙළට සියලු ජාතිකත්වයන් එක්කර ගැනීමත් නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රතිලාභ සියලු ජාතිකත්වයන් අතර බෙදා හැරීමත් මගින් තනි ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස පරිකල්පනයට සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනයාට ඉඩකඩ සැපයීමයි. සිංහල, දෙමළ සහ මුස්ලිම් ගැහැනු හා පිරිමි සියලු දෙනා සිංහ කොඩියක් යට සිටවූ පමණින් ශ්‍රී ලාංකේය ජාතිය බිහිවේ

යැයි දූෂිත ප්‍රභූ පාලක පංතිය කළ ව්‍යාජ අපේක්ෂාව ඉක්මවා ගිය ශ්‍රී ලාංකේය ජාතිය බිහිකිරීමේ ද්‍රව්‍යාත්මක කොන්දේසිය නිෂ්පාදන ආර්ථිකයයි. විසිවන සියවසේ වීරයන් හා වීරවරියන් ප්‍රාර්ථනා කළ සමාජ සාධාරණත්වය මූලික පදනම වූ නූතන රාජ්‍යය ජාතික ජනබලවේගයේ පාලනයක් යටතේ බිහිවනු ඇත. ඒ දියසෙන් පන්නයේ ගැලවුම්කරුවෙකුගේ නැවත ඉපදීම හේතු කොට ගෙන නොව ලාංකේය මිනිසුන්ගේ සාමූහික ව්‍යායාමයක් ලෙසිනි. ජාතික ජන බලවේගය බලයට පත්වීම යනු අවුරුදු 76ක් පුරාවට සිදුවූ ආකාරයේ තවත් ආණ්ඩු මාරුවක් නොව එම ඉතිහාසයෙන් ගැලවීම හා සමාන්තරව සිදුවන දැවැන්ත සමාජ පරිවර්තනයකි; පිම්මකි; පුනරුදයකි. එය විසිවන සියවසේ සැබෑ විරුවන් හා වීරවරියන් අපේක්ෂා කළ අදූෂිත දේශපාලන සංස්කෘතියේ, නිෂ්පාදන ආර්ථිකයේ, සමාජ සාධාරණත්ව භාවිතයේ, සාමූහික මැදිහත්වීමේ හා ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැංවීමේ පුනරුදයක් මෙන්ම සංස්කෘතික, පාරිසරික, පුරවැසි ක්‍රියාකාරකම්, විද්‍යා හා තාක්ෂණික, අන්තර්ජාතික ගනුදෙනු වැනි සමාජය පුරා පැතිරුණු කලාප ගණනාවක පුනරුදයකි.

බටහිර යටත්විජිතවාදීන්ගේ උගුල වන අතීතය අපට බාර දී වර්තමානය හා අනාගතය ඔවුන්ගේ අයිතිය යටතේ තබා ගැනීමේ වුවමනාවෙන් ගැලවී අතීතය වර්තමානය හා අනාගතය එක විට අයත්කර ගැනීමේ නව ජාතික පුනරුද මොහොත ජාතික ජනබලවේගයේ ජයග්‍රහණයෙන් අරඹමු.

"නිදහසින් පසු සමාජ මනස මෙහෙය වූද අතීතය උත්කර්ෂයට නැංවූද ආඛ්‍යානය විසින් නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යයක් බිහි කිරීමේ පදනම් තම ක්ෂේත්‍රයන් තුළ විසිවන සියවසේදී සකස් කළ සැබෑ වීරයන් සහ වීරවරියන් යටපත් කර දමනු ලැබ ඇති අතර දූෂිත ප්‍රභූ පංතියේ ව්‍යාජ වීරයන් ඉස්මතු කරනු ලැබ ඇත. නිදහසෙන් දශක හතකට පසුව කෘෂිකර්මය හා කාර්මීකරණය සංකලනය කළ ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයක් සහිත නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යයක් තැනීමේ වගකීම භාර ගැනීමට නියමිත ජාතික ජන බලවේගය, ඉතිහාස ආඛ්‍යානයේ විසිවන සියවස ගැන සිදු වූ වැරැද්ද නිවැරදි කිරීම කාලෝචිත මැදිහත් වීමක් ලෙස හඳුනාගනී. තවද විසිවන සියවසේ සැබෑ වීරයන් හා වීරවරියන්ගේ නම් ඉතිහාස ලේඛනයේ සටහන් කිරීම සහ ඔවුන්ගේ සාධනීය පරමාර්ථ මෙන්ම ගෙවුණු සියවස තුළ මිනිස් සමාජය උකහාගත් නව්‍ය ආර්ථික, සමාජීය, සංස්කෘතික වර්ධනයන් නූතන තත්වයන්ට සේම ලංකාවට ගැලපෙන ලෙස සකස් කර ගැනීම මේ දේශපාලන මොහොත තුළ කළ යුතු වැදගත් කාර්යයක් ලෙසට ජාතික ජන බලවේගය යෝජනා කරයි."

ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

Address: 464/20, Pannipitiya Road, Battaramulla, Sri Lanka
Web: www.npp.lk
Email: contact@npp.lk
Tel: 0112785612, 0777199524

ISBN 978-624-5602-01-8
9786245602018
ආධාරය රු. 100/-